



වාර්ෂික වාර්තාව

2019

ජාතික අධ්‍යාපන ආයතනය

මහරගම

ජාතික අධ්‍යාපන ආයතනය
කළමනාකරණ මණ්ඩලය

ආචාර්ය ටී.ඒ.ආර්.පේ. ගුණසේකර මහත්මිය
අධ්‍යක්ෂ ජනරාල්

ආචාර්ය පූජ්‍ය මාඹුල්ගොඩ සුමනරතන හිමි
නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්
භාෂා මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය

කේ.ඩබ්ලිව්.බී.එම්.පී. විජේසුන්දර මහතා
නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්
පාලන, මූදල් හා සහාය සේවා

එන්.වී.ඒ.එස්. සමරසිංහ මහතා
නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (වැ.බ.)
ගුරු අධ්‍යාපන හා විකල්ප අධ්‍යාපන පීඨය

ජාතික අධ්‍යාපන ආයතනය

අධ්‍යක්ෂ මණ්ඩලය

ඩී.ඒ. ජයලාල් මහතා
අධ්‍යක්ෂ
තොරතුරු තාක්ෂණ දෙපාර්තමේන්තුව

ආර්.එම්.පී.ඒ. රණසිංහ මහතා
අධ්‍යක්ෂ
විදුහුන් ප්‍රචාරණ දෙපාර්තමේන්තුව

කේ.ආර්. පත්මසිරි මහතා
අධ්‍යක්ෂ
ගණිත දෙපාර්තමේන්තුව

ආචාර්ය එස්.ඒ.ඩී. සමරවීර මහතා
අධ්‍යක්ෂ
ඉංග්‍රීසි භාෂා දෙපාර්තමේන්තුව

ආචාර්ය වී.ඩී.ඒ.පී. පෙරේරා මහත්මිය
අධ්‍යක්ෂ
බාහිර සම්පත් කළමනාකරණ අංශය

එම්.ජී.ආර්. ධනවර්ධන මහත්මිය
අධ්‍යක්ෂ
සමාජ විද්‍යා දෙපාර්තමේන්තුව

ඒ.කේ.ඒ.ආර්. අලහකෝන් මහත්මිය
අධ්‍යක්ෂ
ඉංජිනේරු සේවා දෙපාර්තමේන්තුව

ටී. මාලනී මහත්මිය
අධ්‍යක්ෂ
මුදල් දෙපාර්තමේන්තුව

එම්.ආර්.ඩබ්ලිව්. මද්දුම මහතා
අධ්‍යක්ෂ
සිංහල භාෂා දෙපාර්තමේන්තුව

ජී.එච්. අශෝකා මහත්මිය
අධ්‍යක්ෂ
සම්භාව්‍ය භාෂා, විදේශ භාෂා හා ද්විභාෂා අධ්‍යාපන දෙපාර්තමේන්තුව

ඩී.එච්. පලිහක්කාර මහතා
අධ්‍යක්ෂ
අධ්‍යාපන පරිපාලන හා සංවර්ධන දෙපාර්තමේන්තුව

ආචාර්ය ඒ.ඩී.ඒ. ද සිල්වා මහතා
අධ්‍යක්ෂ
විද්‍යා දෙපාර්තමේන්තුව

ආචාර්ය පී.එච්. කුසුමාවතී මහත්මිය
අධ්‍යක්ෂ
වාණිජ දෙපාර්තමේන්තුව

ආර්.එම්.කේ. ද සිල්වා මහත්මිය
අධ්‍යක්ෂ
මූල් ළමාවිය සංවර්ධන හා ප්‍රාථමික අධ්‍යාපන දෙපාර්තමේන්තුව

ආචාර්ය ඩී. කැප්පෙටිගොඩ මහතා
අධ්‍යක්ෂ
පර්යේෂණ හා සංවර්ධන දෙපාර්තමේන්තුව

එම්.ඒ.අයි.පී. පෙරේරා මහත්මිය
අධ්‍යක්ෂ
විභාග දෙපාර්තමේන්තුව

පටුන

1 කොටස : ප්‍රගති වාර්තාව

2 කොටස : විගණකාධිපති වාර්තාව

3 කොටස : මුදල් ප්‍රකාශය පිළිබඳ පැහැදිලි කිරීමේ වාර්තාව

4 කොටස : මුදල් ප්‍රකාශ පිළිබඳ සටහන්

ප්‍රගති වාර්තාව - 2019

1.0 හැඳින්වීම

1.1 ආයතනයේ අරමුණු

1985 අංක 28 දරණ පාර්ලිමේන්තු පනතට අනුව, පහත සඳහන් අරමුණු ඉටු කර ගැනීම් වස්, ජාතික අධ්‍යාපන ආයතනයට නෛතික බලය පවරා දී ඇත.

(අ) ශ්‍රී ලංකාවේ අධ්‍යාපනය වැඩි දියුණු කිරීම සඳහා සැලසුම්, වැඩ සටහන් සහ ක්‍රියාකාරකම් සම්බන්ධයෙන් විෂයභාර අමාත්‍ය තුමාට උපදෙස් දීම.

(ආ) අධ්‍යාපනයේ විශේෂිත විෂය ක්ෂේත්‍රයන්හි පශ්චාත් උපාධි අධ්‍යාපනය වර්ධනය කිරීම හා ඒ සඳහා සැලසුම් සැපයීම.

(ඇ) අධ්‍යාපන පද්ධතියෙහි, කාර්ය සාධනය, අරමුණු, ව්‍යුහ, අන්තර්ගතය සහ විධික්‍රම ද අධ්‍යාපනයේ සමාජීය, ආර්ථික සහ වෙනත් අංග ඇතුළුව ඒ පිළිබඳ අධ්‍යයන පැවැත්වීම සහ එම අධ්‍යයන වර්ධනය කිරීම.

(ඈ) අධ්‍යාපනික අභිමතාර්ථ සඳහා තාක්ෂණය අනුවර්තනය කිරීම ඇතුළුව, අධ්‍යාපන පද්ධතියේ නවීකරණ ක්‍රියාවලි ආරම්භ කිරීම සහ වර්ධනය කිරීම.

(ඉ) අධ්‍යාපන පද්ධතියේ නියුක්ත වූවන්ගේ වෘත්තීය සහ සාමාන්‍ය කාර්යක්ෂමතාව වර්ධනය කිරීමට අවශ්‍ය පහසුකම් සැපයීම.

(ඊ) රජයට සහ වෙනත් අනුමත සංවිධාන වලට, අධ්‍යාපනය හා සම්බන්ධ විශේෂිත සේවා ලබා දීම සහ ඇමතිතුමා විසින් අනුමත අධ්‍යාපන සංවර්ධන වැඩ සටහන් ක්‍රියාත්මක කිරීම.

(උ) සමාන අභිමතාර්ථ ඇති වෙනත් ආයතන සමඟ සහ සම්බන්ධ වීම.

ඒ අනුව සමාජීය - ආර්ථික තත්ත්වයට උචිත, දේශීය සහ ගෝලීය ඉල්ලුමට මුහුණ දිය හැකි ශක්‍යතාවයෙන් යුත් පුරවැසියන් වර්ධනය කිරීමට සැලසුම් කර ඇති පාඨමාලාවක් මඟින් පාසල් පද්ධතියට කාර්යක්ෂම දක්ෂ වෘත්තිකයන් සැපයීමේදී නායකත්වය සැපයීමට ද, අධ්‍යාපන සංවර්ධනය සඳහා, ප්‍රතිපත්ති සාධනය පහසු කරවීම සහ එම මග පෙන්වීමට පර්යේෂණ කිරීම සඳහා විද්‍යාත්මක තොරතුරු පදනමක් ස්ථිර කිරීමට ද, අවශ්‍ය ගුණාත්මක අධ්‍යාපනයක් සැපයීම - පිළිබඳ වගකීම ජාතික අධ්‍යාපන ආයතනය මඟින් දරනු ලැබේ.

විෂයමාලාව ක්‍රියාත්මක කිරීමේ වර්තමාන සැලැස්ම අනුව, සෑම අට අවුරුද්දක් අවසානයේ දී, විෂයමාලාවේ පූර්ණ වෙනසක් ඇති කරමින්, විෂයමාලා වර්ධනයක් හෝ විෂය මාලා පුනර්පරීක්ෂණයකට හෝ භාජනය කෙරේ. නවීකරණය කරන ලද විෂයමාලාව 2012 වර්ෂයේදී ක්‍රියාත්මක කිරීමෙන් පසුව ඊලඟ චක්‍රයට විෂයමාලාව යුක්ති යුත්ත කිරීම පහත සඳහන් නිර්ණායක පදනම් කොට 2015 දී ආරම්භ කරන ලදී.

- පාසල් පද්ධතිය තුළ විෂයමාලාව ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් ජාතික අධ්‍යාපන ආයතනයේ, විෂයමාලා සංවර්ධකයින් විසින් කරන ලද අධ්‍යයන මගින් පැහැදිලි වූ තොරතුරු

- විවිධ සමාජ කණ්ඩායම් මගින්, විෂයමාලාව පිළිබඳ ඉදිරිපත් කරන ලද මත සහ යෝජනා

- විෂයමාලාවන් ක්‍රියාත්මක කිරීම සහ සංවර්ධනය කිරීම පිළිබඳ ලෝකයේ වෙනත් රටවල් ලබා ඇති සාර්ථක අත්දැකීම්

- සෑම විෂය ක්ෂේත්‍රයකටම නව ඉගෙනුම් ක්‍රම සහ නව දැනුම ඒකාබද්ධ කිරීම.

2019 වර්ෂයේ පාසල් විෂය මාලාවේ ප්‍රධාන යොමුව වූයේ යථාවත් කරන ලද 5 වන ශ්‍රේණියේ විෂයමාලාව, පාසල් මට්ටම තුළ ක්‍රියාත්මක කිරීම, එම ක්‍රියාත්මක කිරීම අධීක්ෂණය කිරීම සහ, 2020 වර්ෂයේ දී 5 වන වසර ගුරු අත්පොත ක්‍රියාත්මක කිරීමට පළාත් මට්ටමේ පුහුණුකරුවන් පුහුණු කිරීම සහ 4 වන ශ්‍රේණිය ගුරු අත්පොත සකස් කිරීමය.

තවද, ජාතික අධ්‍යාපන ආයතනයට අදාළ සේවක මණ්ඩලය '2020 ඔබබට' සඳහා නව, පුනරීක්ෂණ පාඨමාලාවකට සූදානම් විය යුතු බවට ද තීන්දු කරන ලදි. සාකච්ඡා මණ්ඩපයක දී, මෙසේ ගැමුරින් කරන ලද අධ්‍යයන ඉදිරිපත් කරන ලදි. 6 - 11 ශ්‍රේණි සඳහා මෙම පර්යේෂණ අධ්‍යයන සොයා ගැනීම් මත සකස් වූ විෂයමාලා රාමු 2019 වර්ෂයේදී කෙටුම්පත් කරන ලදි.

1.2 මූල්‍ය සැපයුම

අධ්‍යාපන ආංශික සංවර්ධන වැඩසටහන හඳුන්වා දීමෙන් අනතුරුව, විෂයමාලා සංවර්ධන අදාළ කටයුතු සඳහා මූලික වශයෙන් මූල්‍යමය ප්‍රතිපාදන සපයා ගනු ලැබුවේ සාමාන්‍ය අධ්‍යාපන නවීකරණය ව්‍යාපෘතිය මගින් සපයන ලද අරමුදල, එක්සත් ජාතීන්ගේ අරමුදල, අධ්‍යාපන අමාත්‍යාංශයෙන් ලත් අරමුදල් සහ ආයතනය මගින් උපයා ගන්නා ලද ආදායම ද මඟිනි. එසේ මීපේ දකුණු ආසියානු ගුරු සංවර්ධන මධ්‍යස්ථාන නේවාසිකාගාර සංකීර්ණය සඳහා ගණනය කරන ලද මූල්‍ය වියදම්, අධ්‍යාපන අමාත්‍යාංශය වෙතින් සපයනු නොලැබුණි.

වගුව 1: 2019 වර්ෂය සඳහා ආයතනයේ වියදම් පහත සඳහන් වගුව මගින් ඉදිරිපත් කෙරේ.

මූල්‍ය ප්‍රභවය	පුනරාවර්තන වියදම්		ප්‍රාග්ධන වියදම්	
	සංශෝධිත ප්‍රතිපාදනය	සත්‍ය වියදම	සංශෝධිත ප්‍රතිපාදනය	සත්‍ය වියදම
ඒකාබද්ධ අරමුදල	465,000,000	458,034,332	90,000,000	64,879,905
සාමාන්‍ය අධ්‍යාපන නවීකරණ ව්‍යාපෘතිය	25,000,000	25,000,000	-	-
ජාතික අධ්‍යාපන ආයතනයේ ආදායම	178,089,000	141,819,716	292,083,000	133, 699,481
එක්සත් ජාතීන්ගේ ළමා සංවර්ධන අරමුදල	15,000,000	15,000,000	-	-
අධ්‍යාපන අමාත්‍යාංශය ඒකාබද්ධ අරමුදල	145,000,000	131,059,685	150,000,000	
කොරියානු ජාතික කොමිසම	4,200,000	4,157,904	-	-

1.3 කාර්ය මණ්ඩල සැපයුම

පාර්ලිමේන්තු පනත මගින් ආයතනයට පවරා ඇති කාර්යයන් ක්‍රියාත්මක කිරීමට අමතරව, රාජයේ ප්‍රමුඛත්වය ලබා දී ඇති, දහතුන් වසරක සහතික කරන ලද අධ්‍යාපන වැඩසටහන සහ පාසල් පාදක ඇගයීම් වැඩසටහනු වැනි, නව වැඩසටහන්, ආයතනයේ දැනට ඇති සේවක සංඛ්‍යාව විසින් මහත් කැපවීමකින් නොයෙක් දුෂ්කරතා මධ්‍යයේ - ක්‍රියාත්මක කොට වැඩිදියුණු කිරීමට ද කළ යුතු වේ.


පහත සඳහන් වගුවෙන් ජාතික අධ්‍යාපන ආයතනයේ සේවක තත්ත්වය පිළිබඳ පැහැදිලි චිත්‍රයක් දෙනු ලැබේ.

කාණ්ඩය	අනුමත කාර්ය මණ්ඩලය (01.01.2019 දිනට)	පවත්නා කාර්ය මණ්ඩලය (31.12.2019 දිනට)			පුරප්පාඩු සංඛ්‍යාව (31.12.2019 දිනට)
		පුරප්පාඩු	සේවා	එකතුව	
අධ්‍යක්ෂ ජනරාල්	01	00	01	01*	00
අතිරේක අධ්‍යක්ෂ ජනරාල්	01	01	00	01	00
නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්	06	02	00	02	04
අධ්‍යක්ෂ	27	09	08	17	10
සභා ලේකම් (අධ්‍යාපන)	01	00	01	01**	00
ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය/ජ්‍යේෂ්ඨ අධ්‍යාපනඥ	72	33	37	70	02
කථිකාචාර්ය / අධ්‍යාපනඥ	75	05	05	10	65
සහකාර කථිකාචාර්ය/සහකාර අධ්‍යාපනඥ	90	37	50	87***	03
අනධ්‍යයන කාර්ය මණ්ඩලය	379	143	174	317	62
එකතුව	**652**	**230**	**276**	**506**	**146**

* කොන්ත්‍රාත් පදනම
** දෛනික ගෙවීම්
*** අනුයුක්ත
**** අනියම් / කොන්ත්‍රාත් පදනම / දෛනික ගෙවීම්

2019 වර්ෂයේ සේවක තනතුරු අඩුපාඩු මඟහරවා ගැනීමට දරන ලද වෑයම් කිහිපයකටම පසුව ආයතනය සහකාර කථිකාචාර්ය තනතුරු 36 ඇතුළු කාර්ය මණ්ඩල තනතුරු 56 ක් යොදවා ගෙන ඇත.

පහත දී ඇති රූපය මඟින් සුදුසුකම් අනුව ආයතනයේ සේවක මණ්ඩලය ඉදිරිපත් කෙරේ.



2.0 ජාතික අධ්‍යාපනයේ සංවිධාන ව්‍යුහය

2.1 ආයතන සභාව - 2019

ජාතික අධ්‍යාපන ආයතන පනතේ ප්‍රතිපාදනයනට යටත්ව, ආයතන සභාවට පහත සඳහන් බලතල ඇත:

- නීතිරීති මඟින් නියම කරන ලද, බඳවා ගැනීමේ පටිපාටිය සහ පත් කිරීම් සම්බන්ධ ක්‍රියා පිළිවෙලට අනුව, ආයතනයට කාර්ය මණ්ඩල පත් කිරීම.
- ආයතනයේ කාර්ය මණ්ඩලයේ, වැටුප්, වේතන සහ වෙනත් දීමනා සහ සේවා නියමයන් සහ කොන්දේසි තීරණය කිරීම.

- ආයතනයේ විනය සම්බන්ධයෙන් විධි විධාන පැනවීම.
- ආයතනයේ කාර්ය මණ්ඩලයේ යහපත උදෙසා, අර්ථසාදක අරමුදල් සහ වෙනත් යෝජනා ක්‍රම ස්ථාපිත කිරීම සහ විධිමත් කිරීම.
- පාලක සභාව මගින් පවත්වනු ලබන විභාග සඳහා පත්වීමට සුදුසු පරීක්ෂකයන්ගේ නම් ආයතන සභාවට නිර්දේශ කිරීම.
- ආයතන සභාව මගින් අනුමත කරන ලද කොන්දේසි සපුරා ප්‍රදාන, ශිෂ්‍යත්ව සහ වෙනත් තෑගි වලට සුදුසුකම් ලබා ඇති අය එම ශිෂ්‍යත්ව, පදක්කම් සහ තෑගි ප්‍රදානය සඳහා පාලක සභාවට නිර්දේශ කිරීම.
- පාලක සභාවේ අවසරය ඇතිව, පාලක සභාවේ සාමාජිකයන්ට අමතරව, වෙනත් කමිටු සඳහා සුදුසු පරිබාහිර පුද්ගලයන් පත් කිරීම.

ජාතික අධ්‍යාපන ආයතන පනතට අනුව ආයතනයේ පාලක සභාවට, මූල්‍ය සහ පාලන බලතල පැවරී ඇත. 2019 වර්ෂය තුළ පහත සඳහන් සභිකයන්, ආයතන සභාවේ සේවය කරන ලදි.

පද්මසිරි ජයමාන්න මහතා	-	*සභාපති*
(ලේකම්, අධ්‍යාපන අමාත්‍යාංශය)		*(2019 මාර්තු)*
එම්.එන්. රණසිංහ මහතා මහතා	-	*සභාපති*
(ලේකම්, අධ්‍යාපන අමාත්‍යාංශය)		*(2019 අප්‍රේල් - ඔක්තෝම්බර්)*
ආචාර්ය ටී.ඒ.ආර්.ජේ. ගුණසේකර මහත්මිය	-	*සාමාජික*
(අධ්‍යක්ෂ ජනරාල්, ජාතික අධ්‍යාපන ආයතනය)		
තිස්ස හේවාවිතාරණ මහතා	-	*සාමාජික*
(රාජ්‍ය ලේකම්, අධ්‍යාපන අමාත්‍යාංශය)		
එස්.එච්. කුමාරසිංහ මහතා	-	*සාමාජික*
(වීදුහල්පති (විශ්‍රාමික) රාජකීය විදුහල, කොළඹ 07)		
මහාචාර්ය බී.එස්.එම්. ගුණරත්න මහතා	-	*සාමාජික*
(උප සභාපති, විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව)		
ආචාර්ය හේමමාලා රත්වත්ත මහත්මිය	-	*සාමාජික*
(ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, භාෂා අධ්‍යයන දෙපාර්තමේන්තුව, විවෘත විශ්ව විද්‍යාලය)		
එම්.කේ. ප්‍රදීප් කුමාර මහතා	-	*සාමාජික*
(අධ්‍යක්ෂ, වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති දෙපා., මුදල් අමාත්‍යාංශය)		
ඊ.ඒ. රත්නසීල මහතා	-	*සාමාජික*
(අධ්‍යක්ෂ, මුදල් දෙපාර්තමේන්තුව, මුදල් සහ ජනමාධ්‍ය අමාත්‍යාංශය)		
ඒ.එම්.ආර්.බී. අමරකෝන් මහතා	-	*සාමාජික*
(කොමසාරිස් ජනරාල් (විශ්‍රාමික) විභාග දෙපාර්තමේන්තුව)		

දොස්තර හර්ෂ සුබසිංහ මහතා	-	*සාමාජික*
එම්.එම්. ක්‍රිෂාන්ති මෙනෙවිය	-	*සාමාජික*
(අධ්‍යක්ෂ, රාජ්‍ය නොවන උසස් අධ්‍යාපන ඒකකය)		
ආචාර්ය ජයදේව උයන්ගොඩ මහතා	-	*සාමාජික*
(සම්මානනීය මහාචාර්ය, දේශපාලන විද්‍යාව සහ		
රාජ්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව)		
ඩී.එල්.ඩී.ඩී. සේනානායක මහතා	-	*සාමාජික*
(ලේකම් - කොන්ත්‍රාත් පදනම මත 2019.01.01 දින සිට)		

2.2 ශාස්ත්‍රීය කටයුතු මණ්ඩලය

ආයතන සභාවට අමතරව, අධ්‍යාපන කළමනාකරණ, අධ්‍යාපන පරිපාලනය සහ වෙනත් අදාළ ක්ෂේත්‍රයන්හි විශේෂඥයින්ගෙන් සැදුම් ලත්, ශාස්ත්‍රීය කටයුතු මණ්ඩලය, ආයතනයේ සියලු අධ්‍යාපන කටයුතු සම්බන්ධයෙන්ද, අධ්‍යාපනික සහ ආයතනික නායකත්වයක් සැපයීමෙහි ද, පහත සඳහන් කටයුතු සම්බන්ධයෙන් අධීක්ෂණය සහ උපදේශනයන් ලබා දීම සම්බන්ධයෙන් ද වගකිව යුතු වේ.

- සියලු ශාස්ත්‍රීය කටයුතු සම්බන්ධයෙන් ආයතන සභාවට උපදෙස් සැපයීම.
- ආයතන සභාව විසින් පවරන ලද කිසියම් කාර්යයක් වේ නම් ඒ පිළිබඳ සළකා බලා වාර්තාවක් සැපයීම.
- ආයතනය මගින් පවත්වනු ලබන හෝ ක්‍රියාත්මක කෙරෙන විභාග, වැඩසටහන්, පුහුණු වැඩසටහන් සහ පාඨමාලා හා සම්බන්ධ කරුණු පාලක සභාවට වාර්තා කිරීම සහ නිර්දේශ යෝජනා කිරීම.
- ආයතනය විසින් පවත්වනු ලබන පාඨමාලා, පුහුණු වැඩසටහන් හෝ වැඩසටහන් සහ විභාග ආදිය උදෙසා සිසුන් ඇතුලත් කිරීම සම්බන්ධ අවශ්‍යතා / සුදුසුකම් පැනවීම ආයතනයට නිර්දේශ කිරීම.
- ආයතනය විසින් පවත්වනු ලැබෙන පාඨමාලා, ඉගෙනුම් වැඩසටහන්, වැඩසටහන් සහ විභාග ආදිය සම්බන්ධ නීතිරීති ගෙකටුම්පත් කොට, එම කෙටුම්පත් ආයතන සභාවට ඉදිරිපත් කිරීම.

2019 වසරේ ශාස්ත්‍රීය කටයුතු මණ්ඩලය පහත සඳහන් අධ්‍යාපන විශේෂඥයින්ගෙන් සමන්විත විය.

මහාචාර්ය ජයදේව උයන්ගොඩ මහතා	-	*සභාපති (මහාචාර්ය (විශ්‍රාමික)*
දේශපාලන විද්‍යා දෙපා. කොළඹ විශ්ව විද්‍යාලය)		
ආචාර්ය ටී.ඒ.ආර්.ජේ. ගුණසේකර මහත්මිය	-	*සාමාජික*
(අධ්‍යක්ෂ ජනරාල්, ජාතික අධ්‍යාපන ආයතනය)		
මහාචාර්ය ආර්. අරංගල මහතා	-	*සාමාජික*
(සිංහල භාෂා දෙපාර්තමේන්තුව, ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය)		

2.3 අධ්‍යක්ෂ ජනරාල් කාර්යාලය

අධ්‍යක්ෂ ජනරාල්ගේ ලේකම් කාර්යාලය, කාර්යාලයකින්, ඒකක 02 දෙකකින් සහ දෙපාර්තමේන්තුවකින් ද සමන්විත වේ.

- අධ්‍යක්ෂ ජනරාල් කාර්යාලය
- අභ්‍යන්තර විගණන අංශය
- විභාග දෙපාර්තමේන්තුව
- බාහිර සම්පත් කළමනාකරණ ඒකකය

ලේකම් කාර්යාලය ඒකකය, ජාතික අධ්‍යාපන ආයතනයේ, පාලක සභාවට සහ ශාස්ත්‍රීය කටයුතු මණ්ඩලයට අදාළ ලිපි ලේඛන සැකසීම හා බෙදා හැරීම ද, වාර්තා පවත්වා ගෙන යෑම සහ පාලක සභාවේ සහ ශාස්ත්‍රීය කටයුතු මණ්ඩලයේ තීන්දු තීරණ, අදාළ ඡීඨ සහ අංශවල දැනුම් දීම ද, සම්බන්ධයෙන් වගකිව යුතු වේ. පසුගිය වර්ෂය තුළ, පාලක සභා රැස්වීම් නවයකට (09) ද ශාස්ත්‍රීය කටයුතු මණ්ඩල රැස්වීම් දොළහකට ද (12) අදාළ සම්බන්ධීකරණය ඉටු කොට ඇත.

විභාග දෙපාර්තමේන්තුව, කාර්යක්ෂම සහ ඵලදායී විභාග පද්ධතියක් පවත්වා ගෙන යෑම සහ එහි ගුණාත්මක බව පවත්වා ගෙන යෑම සම්බන්ධයෙන් වගකිව යුතු වේ. ජාතික අධ්‍යාපන ආයතනය, වෘත්තීය වර්ධන පාඨමාලා කිහිපයක්ම පවත්වා ගෙන යන බැවින්, එය සහතිකකරණය උදෙසා, කාර්යක්ෂමව සහ ඵලදායී විභාග ක්‍රමයක් පවත්වා ගෙන යෑම අත්‍යවශ්‍ය වේ. 2019 වර්ෂය තුළ පහත සඳහන් පාඨමාලා පවත්වා, ඇගයීම් කොට සහතික පත්‍ර ද ලබා දී ඇත.

- ගණිතය ඉගැන්වීම පිළිබඳ උසස් ඩිප්ලෝමා පාඨමාලාව - (අවසාන)
- පූර්ව ළමාවිය සංවර්ධනය පිළිබඳ ඩිප්ලෝමා -2017 /2018 (අවසාන)
- අතිරේක භාෂා සංවර්ධන ඩිප්ලෝමා පාඨමාලාව - 2018 / 2019 (අවසාන)
- විශේෂ අධ්‍යාපන ඩිප්ලෝමා පාඨමාලාව - 2018 (අවසාන)
- සංඥා භාෂා පිළිබඳ ඩිප්ලෝමා - 2018 (අවසාන)
- දෙවන බසක් ලෙස ඉංග්‍රීසි ඉගැන්වීම පිළිබඳ ඩිප්ලෝමා - 2019
- අධ්‍යාපනවේදී උපාධිය - 2017/2019 පළමුවන කොටස - (සාමාන්‍ය)
- අධ්‍යාපන විද්‍යාපති අවසාන විභාගය (2017/2019)
- අධ්‍යාපන කළමනාකරණ පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමා - 2019 (අවසාන) (දෙමළ) පළමු වාරය
- අධ්‍යාපන කළමනාකරණය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමා - 2018 (අවසාන) (දෙමළ) තෙවන වාරය
- අධ්‍යාපන කළමනාකරණ පිළිබඳ (පෙර කණ්ඩායම විභාගය) (දෙවන වාරය) (පැරණි විෂය මාලාව)
- අධ්‍යාපන කළමනාකරණ පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමා 2018 (අර්ධ කාලීන) (දෙවන වාරය)

කේ.එම්.එච්.බණ්ඩාර මහතා - සාමාජික
(ප්‍රධාන කොමසාරිස්, ගුරු අධ්‍යාපන, අධ්‍යාපන අමාත්‍යාංශය)
බී.ඩී.සී. බියන්විල මහතා - සාමාජික
(ප්‍රධාන කොමසාරිස්, ගුරු අධ්‍යාපන, අධ්‍යාපන අමාත්‍යාංශය)
ඒ.කේ. ගණිහිගම මහතා - සාමාජික
(ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය (විශ්‍රාමික) සමාජ විද්‍යා දෙපාර්තමේන්තුව,
ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය.)
මහාචාර්ය ආර්. යූ. හල්වතුර මහතා - සාමාජික
(සිවිල් ඉංජිනේරු දෙපාර්තමේන්තුව, මොරටුව විශ්ව විද්‍යාලය)
ඩබ්ලිව්.බී.පී. නාලිකා මහත්මිය - සාමාජික (2019.03.05)
(කොමසාරිස් ජනරාල්, අධ්‍යාපන ප්‍රකාශන දෙපා., අධ්‍යාපන අමාත්‍යාංශය)
ඩබ්ලිව්.එම්. ජයන්ත වික්‍රමනායක මහතා - සාමාජික (2019.03.05)
(කොමසාරිස් ජනරාල්, අධ්‍යාපන ප්‍රකාශන දෙපා., අධ්‍යාපන අමාත්‍යාංශය)
ආචාර්ය එම්.ටී.එම්. මහීස් මහතා - සාමාජික
(ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, සමාජ විද්‍යා දෙපාර්තමේන්තුව, විවෘත
විශ්ව විද්‍යාලය)
ටී. මුතුකුමාරස්වාමි මහතා - සාමාජික
(හිටපු විදුහල්පති, හින්දු විද්‍යාලය කොළඹ 04)
බී. සනත් පූජිත මහතා - සාමාජික (2017 නොවැම්බර් සිට)
(විභාග කොමසාරිස් ජනරාල්, විභාග දෙපර්තමේන්තුව)
ආචාර්ය ප්‍රසාද් විමලරත්න මහතා - සාමාජික
(ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, පරිගණක පාසල, කොළඹ විශ්ව විද්‍යාලය)
ආචාර්ය ප්‍රියන්ත ප්‍රේමකුමාර මහතා - සාමාජික
(ලේකම්, විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව)
ආචාර්ය මාඹුල්ගොඩ සුමනරතන හිමි - සාමාජික
(නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් - භාෂා මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා)
එන්.වී.ඒ.එස්. සමරසිංහ මහතා - සාමාජික
(වැඩ බලන නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් - ගුරු අධ්‍යාපන හා විකල්ප අධ්‍යාපන)
ඩී.එල්.පී.සී. සේනානායක මහතා - සාමාජික
(ලේකම් - කොන්ත්‍රාත් පදනම මත)

ජාතික අධ්‍යාපන ආයතනයේ පාලක සභාවේ සහ ශාස්ත්‍රීය කටයුතු මණ්ඩලයේ උපදේශනය සහ අධීක්ෂණය යටතේ ජාතික අධ්‍යාපන ආයතනයට පැවරුණු කටයුතු පහත සඳහන් සංවිධාන ව්‍යුහය යටතේ ක්‍රියාත්මක කරන ලදි.

- අධ්‍යාපන කළමනාකරණ පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමා - 2017/2018 (අවසාන)
- අධ්‍යාපන කළමනාකරණ පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමා - 2019 (පූර්ණකාලීන/අර්ධ කාලීන) 11 වාරය
- අධ්‍යාපන කළමනාකරණ පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමා - 2020 (අර්ධ කාලීන/දෙමළ) ප්‍රවේශ විභාගය

අතිරේක විභාගය

- අධ්‍යාපන කළමනාකරණ පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමා - 2018 (පූර්ණකාලීන/දෙමළ) (දෙවන වාරය)
- අධ්‍යාපන කළමනාකරණ පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමා - 2018 (අර්ධ කාලීන/දෙමළ) (පළමු වන වාරය)
- පාසල් කළමනාකර්ණය පිළිබඳ ඩිප්ලෝමා (2017/2018 (දෙවන වාරය)
- පාසල් කළමනාකරණය පිළිබඳ ඩිප්ලෝමා (ප්‍රවේශ විභාගය)
- අධ්‍යාපන පරිපාලනය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමා විභාගය (විශේෂ පුනර්)

අභ්‍යන්තර විගණන ඒකකය, ආයතනයේ ප්‍රධානී වෙත සෘජුව වාර්තා කරයි. ආයතනයේ අභ්‍යන්තර පාලන පද්ධතිය ක්‍රියාත්මක කිරීම මෙම ඒකකය මගින් නිරීක්ෂා කරනු ලැබේ. මේ සම්බන්ධයෙන්, අභ්‍යන්තර විගණන ඒකකය, විගණන වාර්තා 23 ක් සපයා ඇති අතර, විවිධ දෙපාර්තමේන්තු මගින් රු. 75,000 ට වඩා ගෙවීම් කර ඇති ලිපි ගොනු 217 ද පරීක්ෂා කොට ඇත.

බාහිර සම්පත් කළමනාකරණ ඒකකයේ වගකීම වනුයේ විදේශ අරමුදලින් පවත්වා ගෙන යනු ලැබෙන ව්‍යාපෘතීන්ට අදාළ සියලුම කටයුතු පිළිබඳව ද, ආයතනයට උපරිම ප්‍රතිලාභ ලැබෙන සේ දේශීය සහ විදේශීය ආයතනයන්ට අදාළ සියලු කටයුතු ද සමායෝජනය කිරීමය. ඊට අමතරව, මෙම ඒකකය මගින් සියලු බාහිර ශිෂ්‍යත්ව සහ අධිශිෂ්‍යත්ව සම්බන්ධීකරණය කරනු ලැබේ. පසුගිය අවුරුදු පහ තුළ, ජාතික අධ්‍යාපන ආයතනයේ, ශාස්ත්‍රීය කාර්ය මණ්ඩලයට, විදේශීය දිගු කාලීන සහ කෙටි කාලීන වැඩසටහන් සහ ප්‍රදාන මගින් තමාගේ වෘත්තීය හැකියා උද්දීපනය කර ගැනීමේ අවස්ථා කිහිපයක්ම ලබා දී තිබුණි.

2019 වර්ෂය සඳහා පහත සඳහන් දෑ ඉටු කර ඇත.

- මලයාසියාවේ පාසල් ප්‍රධාන තක්සේරුකරණ වැඩ සහටන් උදෙසා මලයා විශ්ව විද්‍යාලයට නිලධාරීන් දොළහක් යවන ලදි.
- දර්ශන ශූරී උපාධි ප්‍රදානෝත්සවය සඳහා නිලධාරීන් හතර දෙනෙකුද, උපාධි සම්මුඛ පරීක්ෂණයක් සඳහා එක් නිලධාරියෙකුද, කළමනාකරණ සහ මිනුම් විශ්ව විද්‍යාලය, මලයාසියාවට සහ ලංකාවට යවන ලදි.
- විදේශ සම්පත් දෙපාර්තමේන්තුව මගින් කෙටි කාලීන පුහුණු වැඩසටහන් සහ සම්මන්ත්‍රණ/ දේශන සඳහා නිලධාරීන් පස් දෙනෙකු යවන ලදි.

2.4 පීඨ සහ අංශ

ආයතනයේ විවිධ දෙපාර්තමේන්තු සහ ඒකක, 2019 සංවිධාන ව්‍යුහය යටතේ සකස් කොට ඇති ආකාරය දැක්වේ.

2.4.1 භාෂා, මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය

මුල් ළමාවිය සංවර්ධන හා ප්‍රාථමික අධ්‍යාපන දෙපාර්තමේන්තුව
සිංහල භාෂා දෙපාර්තමේන්තුව
දෙමළ භාෂා දෙපාර්තමේන්තුව
ඉංග්‍රීසි භාෂා දෙපාර්තමේන්තුව
සෞන්දර්ය අධ්‍යාපන දෙපාර්තමේන්තුව
ආගම් හා සාරධර්ම දෙපාර්තමේන්තුව
සමාජ විද්‍යා දෙපාර්තමේන්තුව

2.4.2 විද්‍යා හා තාක්ෂණ පීඨය

විද්‍යා දෙපාර්තමේන්තුව
ගණිත දෙපාර්තමේන්තුව
තාක්ෂණික අධ්‍යාපන දෙපාර්තමේන්තුව
වාණිජ දෙපාර්තමේන්තුව
තොරතුරු තාක්ෂණ දෙපාර්තමේන්තුව
සෞඛ්‍ය හා ශාරීරික අධ්‍යාපන ඒකකය
මුද්‍රණ හා ප්‍රකාශන දෙපාර්තමේන්තුව

2.4.3 පර්යේෂණ, සැලසුම් හා සංවර්ධන පීඨය

සැලසුම් සහ ඇගයීම් දෙපාර්තමේන්තුව
පර්යේෂණ සහ සංවර්ධන දෙපාර්තමේන්තුව
පාසල් පාදක තක්සේරු කරන ඒකකය

2.4.4 අධ්‍යාපන නායකත්ව සංවර්ධන හා කළමනාකරණ පීඨය

වෘත්තීය සංවර්ධන සහ කළමනාකරණ දෙපාර්තමේන්තුව
අධ්‍යාපන පරිපාලන සහ සංවර්ධන දෙපාර්තමේන්තුව
විදේශීය පාඨමාලා ඒකකය

2.4.5 ගුරු අධ්‍යාපන හා විකල්ප අධ්‍යාපන පීඨය

ගුරු අධ්‍යාපන දෙපාර්තමේන්තුව
ආයතනික සංවර්ධන දෙපාර්තමේන්තුව
අන්තර්කරණ අධ්‍යාපන දෙපාර්තමේන්තුව
සම්භාව්‍ය/විදේශීය භාෂා සහ ද්විභාෂා අධ්‍යාපන දෙපාර්තමේන්තුව
විද්‍යුත් ප්‍රචාරණ දෙපාර්තමේන්තුව
මාර්ගෝපදේශන හා උපදේශන ඒකකය
විවෘත පාසල් ඒකකය

2.4.6 පරිපාලන, මූල්‍ය හා සහාය සේවා අංශය

පරිපාලන සහ මානව සම්පත් දෙපාර්තමේන්තුව
මුදල් දෙපාර්තමේන්තුව
ඉංජිනේරු සහ නඩත්තු සේවා දෙපාර්තමේන්තුව
පුස්තකාල සහ කෞතුකාගාර දෙපාර්තමේන්තුව
ප්‍රවාහන ඒකකය

2019 වර්ෂය තුළ ජාතික අධ්‍යාපන ආයතනයේ විශේෂ කටයුතු /සාර්ථක කාර්යයන්

2019 වර්ෂයේ ක්‍රියාත්මක සැලසුමට ඇතුලත් වූ, විෂයමාලා සංවර්ධනය, වෘත්තීය සංවර්ධනය, අධ්‍යාපන පර්යේෂණ ආදී කාර්යයන් ක්‍රියාත්මක කිරීමට අමතරව, 2019 ජාතික අධ්‍යාපන ආයතනය මගින් ක්‍රියාත්මක කරන ලද කාර්යයන් රැසක් වේ.

- ඉගෙනුම පිළිබඳ ජාතික ඩිප්ලෝමා අවසන් කළ ඩිප්ලෝමා ධාරී 6,967ක් සඳහා උපාධි ප්‍රදානෝත්සව පැවැත්වීම, මෙම උත්සව, ජාතික අධ්‍යාපන ආයතනය සහ ඒ ඒ ජාතික විද්‍යාපීඨ සමඟ, එකිනෙකට වෙනස් ස්ථාන හයක (6) පවත්වන ලදී.
- ජාතික අධ්‍යාපන පර්යන්ත, දේශනශාලා, විද්‍යාව/තාක්ෂණය ගණිතය සඳහා විද්‍යාගාර, සහ ආයතනයට ශ්‍රවණාගාරයක් සහිත බහු කාර්ය පස්මහල් ගොඩනැගිල්ලක් ඉදි කිරීම.
- බහු කාර්ය පස්මහල් ගොඩනැගිල්ල විවෘත කරන අවස්ථාවේ දී සහ ආචාර්ය සී.ඩබ්ලිව්.ඩබ්ලිව්. කන්නන්ගර අනුස්මරණ දේශන අවස්ථාවේදී ''දහතුන් වසරක සහතික කරන ලද අධ්‍යාපනයක්'' පිළිබඳ මහජනයා දැනුවත් කරනු වස්, ප්‍රදර්ශන දෙකක් පැවැත්වීම. ඊට අමතරව එදින ''වැනල් එන්අයිඊ'' නමින් යූ ටියුබ් චැනලයක් ද ආරම්භ කරන ලදී.
- කාර්ය මණ්ඩලය උදෙසා කාමර හැට පහකින් යුත් (65) නේවාසිකාගාරයකට අත්තිවාරමද දමන ලදී. මෙහි සම්පූර්ණ ගණනය කරන ලද වියදම වන රුපියල් මිලියන 15.99ක අදාළ ජාතික අධ්‍යාපන ආයතනය මගින් උපයන මුදලින් දරනු ලැබේ.
- පොදු රාජ්‍ය මණ්ඩලීය ඉගෙනුම්, ආයතන සමඟ සහයෝගීත්වයෙන්, 'ශ්‍රී ලංකාවේ විවෘත පාසල් උදෙසා, ස්ත්‍රී පුරුෂ උපමාන සංවර්ධනය' සම්බන්ධයෙන් පර්යේෂණයක් කිරීම.

3.0 විෂයමාලා සංවර්ධනය

ජාතික අධ්‍යාපන ආයතනයේ විෂයමාලා සංවර්ධන කටයුතු ඉටු කරනු ලැබෙනුයේ භාෂා, මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය සහ විද්‍යා සහ තාක්ෂණ යන පීඨ මගිනි.
විෂයමාලා සම්පාදනය සඳහා ආයතනයට පැවරී ඇති බලතල යටතේ, භාෂා, මානව ශාස්ත්‍ර සහ සමාජ විද්‍යා පීඨයට අයත් දෙපාර්තමේන්තු හත, විද්‍යා සහ තාක්ෂණ පීඨයට අයිති දෙපාර්තමේන්තු 6ක් සහ ගුරු අධ්‍යාපන සහ විකල්ප අධ්‍යාපන පීඨයට අයත් සම්භාව්‍ය, විදේශ භාෂා සහ ද්විභාෂා අධ්‍යාපන

දෙපාර්තමේන්තුවත් යන දෙපාර්තමේන්තුවල සහය ඇතිව 2019 වර්ෂයේ දී ජාතික අධ්‍යාපන ආයතනය විෂයමාලා සංවර්ධනයට අදාළ ක්‍රියාකාරකම් 70ක් සපුරා ඇත. මෙම විෂයමාලා සංවර්ධන ක්‍රියාකාරකම් මගින්, පහත සඳහන් අරමුණු ඉටුකර ගැනීම අපේක්ෂා කරන ලද අතර, මේ·යටතේ ක්‍රියාවේ යොදවන ලද සියලුම අභ්‍යාස එම ඉලක්කගත ඒවාම විය.

ඉහත සඳහන් පීඨවල ප්‍රධාන අරමුණු

- සමාජයීය, සංස්කෘතික, ආර්ථික සහ තාක්ෂණික අවශ්‍යතාවනට ගැළපෙන පරිදි විෂය මාලාව සැලසුම් කිරීම, සංවර්ධනය කිරීම හා යථාවත් කිරීම.
- විෂයමාලා නවීකරණය කිරීම හා සමඟ ම අර්ථවත්, ප්‍රායෝගික ඉගෙනුම්/ඉගැන්වීම් ක්‍රියාවලියක් සඳහා පාසල් පද්ධතියට නව ශිල්පීය ක්‍රම හඳුන්වා දීම.
- විෂයමාලා ක්‍රියාකාරකම් සංවර්ධනය කිරීමේ හා ක්‍රියාත්මක කිරීමේ කාර්යන්හි නියුක්ත වූවන්ගේ වෘත්තීය නිපුණතා වැඩි දියුණු කිරීම.
- විෂයමාලා සංවර්ධනය සහ ක්‍රියාත්මක කිරීම පිළිබඳ තොරතුරු අනාවරණය කර ගැනීම වස්, අධ්‍යාපන සංවර්ධනයේ ගුණාත්මක ප්‍රගතියට දායක විය හැකි අධ්‍යයනයන් ක්‍රියාත්මක කිරීම.
- ඉගෙනුම් - ඉගැන්වීම් සහ ඇගයීම් ක්‍රියාමාර්ගවල සාර්ථකත්වය උදෙසා නව විධික්‍රම හඳුන්වා දීම.
- ජාතික භාෂා, ජාත්‍යන්තර භාෂා, තොරතුරු තාක්ෂණ, සන්නිවේදනය ආදීන්හි සිසුන්ගේ නිපුණතා සංවර්ධනය කිරීම.
- සංස්කෘතිය හා ජාතික උරුමය ආරක්ෂා කර ගැනීමට සහ සුරැකීමට අවශ්‍ය නිපුණතා සිසුන් තුළ වර්ධනය කිරීම.
- සමාජයේ විවිධ වාර්ගික ජන සමූහයන් අතර ඇති ආගමික, සංස්කෘතික සහ භාෂාමය වෙනස්කම් අගය කරමින් ශ්‍රී ලංකාව තුළ සහජීවනය අගයමින් ජීවත්වීමට අවශ්‍ය නිපුණතා සිසුන් තුළ වර්ධනය කිරීම.

පහත දැක්වෙන විෂයමාලා ක්‍රියාත්මක කිරීමේ සැලැස්මට අනුව 2015 සිට 2019 දක්වා පද්ධතියේ සෑම ශ්‍රේණියකම යථාවත් කරන ලද විෂයමාලාව ක්‍රියාත්මක කෙරෙන අතර, ඊලඟ පියවර 2020 වර්ෂයේ දී 5 ශ්‍රේණියෙන් ආරම්භ කිරීමට අවශ්‍ය ප්‍රමුඛතාව දෙන ලදි. මේ සම්බන්ධයෙන් ජාතික අධ්‍යාපන ආයතනය සැලසුම්ගත කළ කාර්යයන් පහත දැක් වේ.

වගුව 4 : 2012 - 2020 විෂයමාලා චක්‍රය සඳහා වන විෂයමාලා ක්‍රියාත්මක කිරීමේ සැලැස්ම

කාර්යය	2012	2013	2014	2015	2016	2017	2018	2019	2020
රාමුව සැකසීම	1-5 ශ්‍රේණි 6-11								
විෂයමාලා සැකසීම	6-10 ශ්‍රේණි	1,7,11 ශ්‍රේණි	2,8 ශ්‍රේණි	3,9,12 හා 13 ශ්‍රේණි	4 ශ්‍රේණි	5 ශ්‍රේණි			
ගුරු උපදේශන පොත් සැකසීම		6,10 ශ්‍රේණි	1,7,11 ශ්‍රේණි	2,8,12 ශ්‍රේණි	3,9,13 ශ්‍රේණි	4 ශ්‍රේණි	5 ශ්‍රේණි		
විෂයමාලා පිළිබඳ දැනුවත් කිරීමේ වැඩ සටහන්			6,10 ශ්‍රේණි	1,7,11 ශ්‍රේණි	2,8,12 ශ්‍රේණි	3,9,13 ශ්‍රේණි	4 ශ්‍රේණි	5 ශ්‍රේණි	
විෂයමාලාව ක්‍රියාත්මක කිරීම				6,10 ශ්‍රේණි	1,7,11 ශ්‍රේණි	2,8,12 ශ්‍රේණි	3,9,13 ශ්‍රේණි	4 ශ්‍රේණි	5 ශ්‍රේණි

2019 වර්ෂයේ දී විෂයමාලා සංවර්ධනය සම්බන්ධයෙන් පහත සඳහන් කාර්යයන් ඉෂ්ඨ කර ඇත.

3.1 ප්‍රාථමික අධ්‍යාපනය

- ගුරු මාර්ගෝපදේශ පොත් 14ක අවසාන කෙටුම්පත් සකසා අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුවට භාරදීම.
- ප්‍රධාන ඉගෙනුම් අවධි 3 සඳහා, අත්‍යවශ්‍ය ඉගෙනුම් නිපුණතා සඳහා පරීක්ෂණ මෙවලම් සැකසීම හා අත්හදා බැලීම් සම්පූර්ණ කිරීම.
- සිංහල සහ දෙමළ භාෂා ප්‍රධාන ඉගෙනුම් අවධි 3 සඳහා ගුරු උපදේශන පොත් සම්පූර්ණ කිරීම සහ එම කාර්යය සඳහා සම්පත් පුද්ගලයන් 650 දෙනෙකු පුහුණු කිරීම.
- හතර වන (4) ශ්‍රේණියේ විෂයමාලා පසු පෙවුම් යාන්ත්‍රණයක් සැකසීම.
- දෙවන ජාතික භාෂාව ඉගැන්වීම සම්බන්ධයෙන්, පළාත් ප්‍රාථමික කණ්ඩායම් ශක්තිමත් කිරීම උදෙසා සිංහල සහ දෙමළ භාෂා වලින් පුහුණුවීම් උපදේශන ග්‍රන්ථයක් මුද්‍රණය කිරීම.
- සමාජ ඒකාබද්ධතා සංකල්ප ශක්තිමත් කිරීම වස් අමතර කරුණු අන්තර්ගතය අවසාන කෙටුම්පත නිම කිරීම.
- ළමා කේන්ද්‍රීය විෂයමාලාව සඳහා ජාතික ක්‍රියා රාමුව අවසන් කිරීම.
- ක්‍රියාකාරකම් පදනම් වාචික ඉංග්‍රීසි ශක්තිමත් කිරීමට අමතර කරුණු අන්තර්ගතය අවසාන කෙටුම්පත නිම කිරීම.
- 5 ශ්‍රේණියේ ගුරු උපදේශනය සඳහා පළාත් සම්පත් කණ්ඩායම් වලට අයිති සම්පත් පුද්ගලයන් 650 ක් පුහුණු කිරීම.
- ක්‍රියාකාරකම් පාදක වාචික ඉංග්‍රීසි ශක්තිමත් කිරීම සඳහා සම්පත් පුද්ගලයන් 650ක් පුහුණු කිරීම.

3.2 ද්විකීයික අධ්‍යාපනය

- 6-11 ශ්‍රේණි සඳහා විෂයමාලා සැකිලි කෙටුම්පත් 50ක් සැකසීම.
- 13 ශ්‍රේණියේ මාධ්‍ය අධ්‍යාපනයට අදාළ ගුරු උපදේශනය අවසන් කොට ඇත. දැනට එය ඉංග්‍රීසියෙන් පරිවර්තනය වෙමින් පවතී.
- 12 වන ශ්‍රේණිය උදෙසා කොරියන් භාෂා ගුරු උපදේශනයේ පළමු කෙටුම්පත සකසා ඇත.
- 5 වන ශ්‍රේණිය සඳහා ඉංග්‍රීසියට අදාළ ගුරු උපදේශනය නිමා කොට ඇත.
- සම්පත් පොත් වලට අදාළ කෙටුම්පත් 19 ක් සකසා ඇත.

  (13 ශ්‍රේණිය උදෙසා ජීව විද්‍යාව, භෞතික විද්‍යාව, රසායන විද්‍යාව, බුද්ධාගම සහ බෞද්ධ ශිෂ්‍යාචාරය, හින්දු ආගම සහ හින්දු ශිෂ්‍යාචාරය, ක්‍රිස්තියානි ආගම, ඉස්ලාම් ආගම සහ ඉස්ලාම් ශිෂ්‍යාචාරය, කෘෂි විද්‍යාව, ඉංජිනේරු තාක්ෂණ විද්‍යාව, 12/13 ශ්‍රේණි සඳහා විද්‍යා සඳහා තාක්ෂණය, 10, 11 ශ්‍රේණි සඳහා හිංදි භාෂාව සහ ජපන් භාෂාව)
- ශ්‍රේණි නත සහ අට (7, 8) සඳහා වැඩපොත් දෙකක අවසාන කෙටුම්පත් සැකසීම.
- හයවන (6) ශ්‍රේණිය සඳහා සිංහල, දෙමළ පළමු භාෂාවන්ට අදාළ කියවීම් පොත් දෙකක අවසාන කෙටුම්පත් සැකසීම.
- සීඩී තැටි (CD) එකක් සහ ඩීවීඩී (DVD) තැටි 05ක් සඳහා කථනය නිම කිරීම (පෙරදිග සංගීතය, පිරිවෙන් අධ්‍යාපනය, ජීව පද්ධති තාක්ෂණ සහ මාධ්‍ය අධ්‍යාපනය)
- දහතුන් වන (13) ශ්‍රේණියට අදාළ ගෘහ ආර්ථිකය සඳහා ප්‍රායෝගික උපදේශන පිළිබඳ අවසන් කෙටුම්පත නිම කිරීම.
- උසස් පෙළ ඉතිහාසයට සිතියම් පොතක් දෙමළ භාෂාවට පරිවර්තනය නිම කිරීම.
- ජාතික අධ්‍යාපන ආයතන ජාලය සහ ඉගෙනුම් කළමනාකරණ පද්ධති සඳහා ගුරුවරුන් පිළිබඳ තොරතුරු රැස්කිරීමට අදාළ, ඉගෙනුම් කළමනාකරණ පද්ධතියේ සංවර්ධනයේ තාක්ෂණික කොටස නිම කිරීම.
- හය වන ශ්‍රේණිය (6) ගණිතමය කාර්යයන් උදෙසා සංකල්ප සිතියමට අදාළ ක්‍රියාකාරකම් විස්සක් (20) නිම කිරීම සහ ක්‍රියාකාරකම් දහයක් (10) අත්හදා බැලීම සහ තුන් වන ශ්‍රේණිය උදෙසා ක්‍රියාකාරකම් දහයක් කෙටුම්පත් කිරීම.
- දෙළහ දහතුන (12,13) ශ්‍රේණිවල ජීව විද්‍යා පද්ධති තාක්ෂණය උදෙසා විද්‍යාගාර මඟ පෙන්වීමට අදාළ අවසන් කෙටුම්පත් නිම කිරීම.
- ජීව විද්‍යාව සහ වාණිජ්‍යයට අදාළ අවසාන නිසන්ටු කෙටුම්පත නිම කිරීම.
- හයේ සිට දහතුන දක්වා (6-13) ශ්‍රේණි සඳහා අධ්‍යාපනික මෘදුකාංග විස්සක් (20) නිම කිරීම.
- දෙළහ දහතුන (12,13) ශ්‍රේණියන්ට අදාළ තොරතුරු සන්නිවේදන තාක්ෂණය සඳහා මූලාදර්ශ ප්‍රශ්න සියයක් (100) නිම කිරීම.
- හය එකොළහ ශ්‍රේණියන්ට (6-11) අදාළ ගුරු උපදේශවරුන් හයසිය අසූ දෙකක් (682) සහ උසස් පෙළ ගුරුවරුන් දෙදහස් එකසිය තිස් හයක් (2136) සඳහා පුහුණු වැඩසටහන් නිම කිරීම.

3.3 ද්විභාෂා අධ්‍යාපන

- ද්විභාෂ අධ්‍යාපනය පිළිබඳ පොත් පිංචේ දෙවන කෙටුම්පත් සැකසීම.
- ගුරු සංවර්ධන ද්‍රව්‍ය සකසමින් පවතී. පොකුරු පාසල් පාදක අධ්‍යාපන සංවර්ධන වැඩසටහන සඳහා දැනුවත් කිරීම් එකක් පවත්වා ඇත.
- දැන්වීම් පත්‍රිකා විස්සක (20) සහ පත්‍රිකා විස්සක (20) පළමු කෙටුම්පත් සකසා ඇත.

3.4 පාසල් පාදක ඇගයීම් වැඩසටහන

- පාසල් පාදක ඇගයීම් පිළිබඳ උපදෙස් අත්පොතක් කෙටුම්පත් කොට එය යෝජනා සහ අදහස් උදෙසා අධ්‍යාපන අමාත්‍යාංශයටත් විභාග දෙපාර්තමේන්තුවටත් ඉදිරිපත් කොට ඇත.
- පිරිවෙන් අංශයේ සහභාගිකරුවන් විසිතුන් දෙනෙකු (23) උදෙසා පාසල් පාදක ඇගයීම් පිළිබඳ වැඩසටහන් පවත්වන ලදී.
- පළාත් මට්ටමේ පුහුණු වැඩසටහන් සඳහා දෘෂ්ටි ශ්‍රාව්‍ය චාර්තාකරණ (Video) 3ක් සකසා ඇත.

3.5 දහතුන් වසරක සහතික කරන ලද අධ්‍යාපන වැඩසටහන

එකේ සිට දහතුන (1-13) දක්වා ශ්‍රේණි පද්ධතියේ, පූර්ණ විෂයමාලා සංවර්ධන ක්‍රියාවලිය තුළ, විවිධ සංවර්ධිත උපාය මාර්ග ක්‍රියාවට නංවන ලදී. විභාග පද්ධතියක්, ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියත්, තදින් ව්‍යුහගත කරුණු විෂයමාලාවන් තුළ පැවතීම හේතු කොට, සාර්ථක පුද්ගලයෙකු ලෙස ජීවත්වීමට අවශ්‍ය නියත දැනුමක්, හෝ නිපුණතාවක් හෝ හැකියාවක් ලබා නොගත්, පද්ධතියෙන් හැලෙන සිසුන් සැලකිය යුතු සංඛ්‍යාවක් වේ. ඒ අනුව පද්ධතියේ අඩුපාඩුකම් හඳුනාගෙන ඇත. මෙසේ හඳුනා ගත් හිඳුස්ද, දේශීය සහ ගෝලීය වශයෙන් පවතින අධ්‍යාපන ප්‍රවණතා සහ ඉල්ලුම සලකා බැලීමෙන් ද, ඉහත හඳුනාගත් ප්‍රශ්න විසඳීමට ද, මේ රටේ නිදහස් අධ්‍යාපනයක් උදෙසා, ඉගෙනුම් අවස්ථා කහවුරු කිරීමට ද, රජය විසින් නව අධ්‍යාපන ප්‍රතිපත්තියක් ගොඩනගා, දහතුන් වසරක සහතික කරන ලද අධ්‍යාපන වැඩසටහනක් ගොඩ නගා ඇත.

එම වැඩ සටහනට අදාළ ක්‍රියාකාරකම් පහත සඳහන් පරිදි අවසන් කොට ඇත.

- සාමාන්‍ය සංරචකයට අදාළ ගුරුවරුන් දාහක් (1000) පුහුණු කිරීම (තෙවන අදියර)
- අන්තර මොඩියුල විසිහයක් (26) සමාලෝචනය සහ අන්තර මොඩියුල මුද්‍රණය කිරීම ආරම්භ කොට ඇත.

- වෘත්තීය විෂයයන් විසිහයක් (26) උදෙසා, හැඳින්වීමේ සහ අමතර මොඩියුල සම්බන්ධයෙන් ගුරුවරුන් දෙදහස් හත්සිය හැත්තෑ හතරක් (2774) පුහුණු කිරීම
- වැඩසටහනට අදාළ පාසල් පහලොවක් (15) නිරීක්ෂණයට භාජනය කොට ඇත.
- විදුහල්පතිවරුන් එකසිය පවස් අටක් (158) සහ පාසල් සම්බන්ධීකාරකයන් උදෙසා සිංහල දෙමළ දැනුවත් කිරීම් වැඩසටහන් දෙකක් (02) පවත්වා ඇත.
- ජාල සහ මෘදුකාංග සාධනැගීමට අදාළ උසස් මොඩියුල සම්බන්ධයෙන් ගුරුවරුන් හැත්තෑ පහක් (75) පුහුණු කොට ඇත.
- ජාතික සහ වෘත්තීය අධ්‍යාපනය සහ පුහුණු අංශය, විෂය සම්පත් පුද්ගලයන්, ජාතික අධ්‍යාපන ආයතනයේ අදාළ කාර්ය මණ්ඩල නිලධාරීන්, තෝරාගත් ගුරුවරුන් සහ අධ්‍යාපන අමාත්‍යාංශයේ අනු කාරක සභිකයන් සමඟ, දහතුන් වසරක වැඩසටහනට අදාළ, විෂය පථය, විෂයමාලා අන්තර්ගතය, මොඩියුල ගොඩ නැගීම සහ පුහුණුව සම්බන්ධයෙන් සාකච්ඡාවක් පවත්වන ලදී.

4.0 අධ්‍යාපන නායකත්ව සංවර්ධනය සහ කළමනාකරණය

අධ්‍යාපන නායකත්ව සංවර්ධනය සහ කළමනාකරණ පීඨයේ මූලික කටයුත්ත වනුයේ, අධ්‍යාපන ක්ෂේත්‍රයේ නියුක්ත පුද්ගලයින්ගේ නායකත්ව හැකියාවන් සහ කළමනාකරණ හැකියාවන් උද්දීපනය කිරීමය. ඉහත සඳහන් කාර්යයන් ඉටු කරගැනීම් වස්, පීඨය විසින් අධ්‍යාපන කළමනාකරණය සහ පාසල් පරිපාලනයට අදාළව ඩිප්ලෝමා මට්ටමේ සිට ශාස්ත්‍රපති මට්ටම දක්වා විවිධ පාඨමාලා පවත්වනු ලැබේ.

2019 වර්ෂය තුළ, අධ්‍යාපන නායකත්ව සහ කළමනාකරණ පීඨය මගින් පවත්වනු ලැබූ පාඨමාලා ප්‍රගතිය දැක්වේ.

පාඨමාලාව	අදාළ දෙපාර්තමේන්තුව	පාඨමාලාව පැවැත්වෙන ස්ථානය	සහභාගී වූ සංඛ්‍යාව
පශ්චාත් උපාධි පාඨමාලා අධ්‍යාපන කළමනාකරණ පිළිබඳ විද්‍යාපති	වෘත්තීය සංවර්ධන සහ අධ්‍යාපන	මීපේ	34
පශ්චාත් උපාධි ඩිප්ලෝමා පාඨමාලා අධ්‍යාපන කළමනාකරණය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමා	වෘත්තීය සංවර්ධන සහ අධ්‍යාපන කළමනාකරණ	මීපේ	280
ඩිප්ලෝමා පාඨමාලා පාසල් කළමනාකරණය පිළිබඳ ඩිප්ලෝමා	වෘත්තීය සංවර්ධන හා අධ්‍යාපන කළමනාකරණ	මීපේ	267
විදේශීය සිසුන් සඳහා පාඨමාලා අධ්‍යාපන කළමනාකරණය පිළිබඳ විද්‍යාපති	වෘත්තීය සංවර්ධන සහ අධ්‍යාපන කළමනාකරණ	මීපේ	15

5.0 ගුරුවරුන්ගේ වෘත්තීය සංවර්ධනය

නිර්මාණශීලී අධ්‍යාපන මාදිලි භාවිතා කිරීමෙන්, සංඛ්‍යාතමක විශාල වූත්, විවිධ වූත් ගුරුවරුන්ගේ වෘත්තීය සංවර්ධන අවශ්‍යතා සපුරා ලීම සම්බන්ධයෙන් ජාති අධ්‍යාපන ආයතනයට දීර්ඝ සහ සැළකිය යුතු ඉතිහාසයක් ඇත. විෂයමාලාවකින් හෝ වෙනත් සංවර්ධන ප්‍රවේශාරම්භයක් පද්ධතියට හඳුන්වා දීමෙන් අපේක්ෂිත අරමුණු ඉටුකර ගත හැක්කේ ගුරු සාධකය මතය, එහෙයින් ගුරුවරුන්හට ඵලදායී වෘත්තිකයින් වීමට අවශ්‍ය ආත්ම විශ්වාසය, නිපුණතාව සහ අවබෝධය ලබා දීම ඉලක්ක කොට ගත්, උසස් තත්වයේ උපාධි පාඨමාලා සපයා දීම අවශ්‍යවේ. මේ උදෙසා සමහර විෂයමාලා සංවර්ධන දෙපාර්තමේන්තු මගින් ද, අදාළ ගුරු අධ්‍යාපන දෙපාර්තමේන්තු මගින් ද, දර්ශනපති මට්ටමේ සිට සහතික මට්ටම දක්වා දිවෙන විවිධ ගුරු අධ්‍යාපන පාඨමාලා සැපයේ.

භාෂා, මානව ශාස්ත්‍ර සහ සමාජ විද්‍යා පීඨයට සහ විකල්ප අධ්‍යාපන සහ ගුරු අධ්‍යාපන පීඨයට අදාළ විවිධ දෙපාර්තමේන්තු මගින් කෙරෙන පාඨමාලා ප්‍රගතිය පහත සඳහන් වගුවෙන් දැක්වේ.

පාඨමාලාව	දෙපාර්තමේන්තුව	පාඨමාලාව පැවැත්වෙන ස්ථානය	සහභාගී වූ සංඛ්‍යාව
පශ්චාත් උපාධි පාඨමාලා			
අධ්‍යාපන දර්ශනපති පාඨමාලාව	ගුරු අධ්‍යාපන	ජා.අ.අා.	26
අධ්‍යාපනපති පාඨමාලාව	ගුරු අධ්‍යාපන	ජා.අ.අා./යාපනය	306
පශ්චාත් උපාධි ඩිප්ලෝමා පාඨමාලා පශ්චාත් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමා පාඨමාලාව	ගුරු අධ්‍යාපන	ජා.අ.අා /ප්‍රාදේශීය මධ්‍යස්ථාන 42	3765
උපාධි පාඨමාලා			
අධ්‍යාපනවේදී ගෞරව උපාධි පාඨමාලාව	ගුරු අධ්‍යාපන	ජා.අ.අා/මධ්‍යස්ථාන 01	1045
අධ්‍යාපනවේදී සාමාන්‍ය උපාධි පාඨමාලාව	ගුරු අධ්‍යාපන	ජා.අ.අා./මධ්‍යස්ථාන 37	3860
අධ්‍යාපනවේදී උපාධි පාඨමාලාව (ඉංජිනේරු තාක්ෂණවේදය)	ගුරු අධ්‍යාපන	ජා.අ.අා මධ්‍යස්ථාන 04	397
ඩිප්ලෝමා පාඨමාලා			
දෙවන බසක් ලෙස ඉංග්‍රීසි භාෂාව ඉගැන්වීම පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව	ඉංග්‍රීසි	ජා.අ.අා	14
පූර්ව ළමාවිය සංවර්ධන හා ප්‍රාථමික අධ්‍යාපන ඩිප්ලෝමා පාඨමාලාව	ප්‍රාථමික අධ්‍යාපනය	ජා.අ.අා	49
විශේෂ අධ්‍යාපනය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව	අන්තර්කරණ අධ්‍යාපන	ජා.අ.අා.	58
සංඥා භාෂා ඩිප්ලෝමා පාඨමාලාව	අන්තර්කරණ අධ්‍යාපන	ජා.අ.අා	24
උපදේශනය හා මාර්ගෝපදේශනය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව	උපදේශන හා මාර්ගෝපදේශන ඒකකය	ජා.අ.අා.	122
අතිරේක භාෂා සංවර්ධනය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව	ගුරු අධ්‍යාපන	ජා.අ.අා./මධ්‍යස්ථාන 10	298
කෙටි කාලීන පාඨමාලා			
බ්‍රේල් තේමා පාඨමාලාව	අන්තර්කරණ අධ්‍යාපන	ජා.අ.අා	20
ගණිතය ඉගැන්වීමේ සහතිකපත් පාඨමාලාව	ගණිත	ජා.අ.අා	93
අධ්‍යාපන අධ්‍යයන ක්‍රම පිළිබඳ තේමා පාඨමාලාව	අධ්‍යාපන හා සංවර්ධන	ජා.අ.අා	50

5.1 ආයතන සංවර්ධන

ජාතික අධ්‍යාපන විද්‍යාපීඨ මගින් පවත්වනු ලබන පූර්ව සේවා ගුරු අධ්‍යාපන විෂයමාලා සංවර්ධන සම්බන්ධයෙන් ද ගුරු පුහුණු විද්‍යාල මගින් පවත්වනු ලබන සේවාස්ථ ගුරු අධ්‍යාපන වැඩසටහන් සම්බන්ධයෙන් ද වගකීම ජාතික අධ්‍යාපන ආයතනය මගින් දරනු ලැබේ.

2019 වර්ෂය තුළ පහත සඳහන් මැදිහත්වීම් කෙරී ඇත.

- ක්‍රියාමූලික පර්යේෂණ අධ්‍යයන ප්‍රවර්ධන කිරීම සම්මන්ත්‍රණයක් පැවැත්වීම සහ (පර්යේෂණ) අධ්‍යයන වාර්තා 40ක් ඇගයීම
- ගුරු පුහුණු විද්‍යාලවල අභ්‍යන්තර විභාග දෙකක් සඳහා ප්‍රශ්න පත්‍ර තිහක් (30) සැපයීම
- ජාතික අධ්‍යාපන පීඨ, පීඨාධිපතීන් සහ උප පීඨාධිපතිවරුන් ද, ගුරු පුහුණු විද්‍යාලයන්හි විදුහල්පතීන් ද උදෙසා සාකච්ඡා අවස්ථා හතරක් (04) පැවැත්වීම
- ගුරු අධ්‍යාපන පාඨමාලා සුපරීක්ෂණය උදෙසා, ජාතික අධ්‍යාපන පීඨ සහ ගුරු පුහුණු විද්‍යාලවලට අවස්ථා පහක් (05) යොදා ගැනීම
- ජාතික අධ්‍යාපන පීඨ මගින් පවත්වනු ලබන අධ්‍යාපනවේදී වැඩසටහන උදෙසා නීති රීති ගොඩනැගීම
- සිවි අවුරුදු අධ්‍යයන වැඩ සැලැස්මක් ගොඩ නගා, ඇගයීම් ක්‍රියාවලිය කෙටුම්පත් කිරීම
- අධ්‍යාපනවේදී පාඨමාලාව උදෙසා විස්තරාන්විත පාඨමාලාවේ පළමු කෙටුම්පත් සැකසීම
- නුපුහුණු ගුරුවරුන් හයසිය අට දෙනෙකු (608) ශ්‍රී ලංකා ගුරු සේවයට ඇතුළුවීමට අවශ්‍ය මූලික සුදුසුකම් සපයනු වස් ගුරු පුහුණු වැඩසටහනක් පැවැත්වීම

6.0 විකල්ප අධ්‍යාපනය

ගුරු අධ්‍යාපන හා විකල්ප අධ්‍යාපන පීඨයේ අවධානය, විශේෂයෙන්ම නොයෙක් හේතූන් නිසා විධිමත් අධ්‍යාපනයේ ප්‍රධාන ධාරාවට ඇතුළුවීම මඟහැරී ගියවුන් උදෙසා අධ්‍යාපන අවස්ථා පුළුල් කිරීම කෙරෙහි යොමු වී ඇත. මේ සම්බන්ධයෙන් 'සැමට අධ්‍යාපනය' සහ 'යාවජීව අධ්‍යාපනය' යන සංකල්ප පිළිගෙන ක්‍රියාත්මක කිරීමට ඇප කැප වී ඇති පීඨය, අධ්‍යාපනය සැපයීමට අතිරේක පහසුකම් සපයන සහාය සේවා සහ නවීන තාක්ෂණය මගින් සැපයෙන පහසුකම් යොදා ගැනීමෙන් අධ්‍යාපනය පෘථුල කිරීමේ වෑයම් උපරිමයෙන් ඉෂ්ඨ කිරීමට ඇපකැප වී ඇත. මේ අනුව 2019 වර්ෂය තුළ එම දෙපාර්තමේන්තු / ඒකක මගින් ඉටු කරන ලද කාර්යභාරය පහත සඳහන් ලෙස වේ.

6.1 අන්තර්කරණ අධ්‍යාපනය

සෑමට අධ්‍යාපනය යන සංකල්පය යථාර්ථයක් බවට පත් කිරීම සම්බන්ධයෙන්, අන්තර්කරණ අධ්‍යාපන දෙපාර්තමේන්තුව විශේෂ ස්ථානයක් උසුලයි. විශේෂ අවශ්‍යතා ඇති දරුවන්ට පාසල් විෂයමාලා ගොඩනැගීම, විශේෂ අධ්‍යාපනයෙහි නියුක්ත වූ ගුරුවරුන් සහ ගුරු උපදේශකවරුන්ට පුහුණුව සැපයීම, අමතර විෂයමාලා ද්‍රව්‍ය සැකසීම ආදිය සම්බන්ධයෙන් වගකීම, මෙම දෙපාර්තමේන්තුව මගින් උසුලනු ලැබේ. තවද, අන්තර්කරණ අධ්‍යාපනය, සංඥා භාෂාව සහ බ්‍රේල් අධ්‍යාපනය සම්බන්ධ පාඨමාලා මගින් ඔවුන්ගේ චෘත්තීය වර්ධනය කිරීමේ අවස්ථා ද ඔවුනට සපයා ඇත. මේ කාලය තුළ පහත සඳහන් කාර්යය සපුරා ඇත.

- හතරවන (4) ශ්‍රේණිය උදෙසා (භාෂා, පාරිසරික සබැඳි ක්‍රියාකාරක) සම්බන්ධයෙන් ගුරු උපදේශනය යොදා ගැනීමට අදාළ පාඩම් තිහක් (30) සම්පූර්ණ කිරීම.
- කොරියන් අන්තර්කරණ අධ්‍යාපන පාඨමාලාවේ පළමුවන සහ දෙවන පොත් සිංහලට පරිවර්තනය කිරීම නිමා කිරීම
- විශේෂ අවශ්‍යතා ඇති දරුවන් සඳහා ක්‍රීඩා සහ සෙල්ලම් පිළිබඳ මාර්ගෝපදේශන පොතක් සැකසීම
- සංඥා භාෂාව සඳහා උපදේශන ඩීවීඩියක් (DVD) සැකසීම
- අන්තර්කරණ අධ්‍යාපනය උදෙසා ජාතික සම්මන්ත්‍රණයක් පැවැත්වීම
- විශේෂ අධ්‍යාපන අවශ්‍යතා සහිත දරුවන් තිස් අට දෙනෙකු (38) ඇගයීමට භාජනය කොට දෙමාපිය උපදේශන සැපයීම

6.2 විද්‍යුත් ප්‍රචාරණය

නොවිධිමත් අධ්‍යාපන ක්ෂේත්‍රයේ ආකර්ශණීය සහ ඵලදායී ඉගෙනුම් මෙවලම් වන රූපවාහිනිය, ගුවන් විදුලිය, සංයුක්ත තැටි ආදිය භාවිතය තුළින් පාසල් ප්‍රජාව සහ බාහිර ප්‍රජාව ද, ඉගෙනුම් සමාජයක් බවට පත් කිරීමට දායක වීමෙන්, ජාතික අධ්‍යාපන ආයතනය වැදගත් සේවයක් ඉටු කරයි. පාසල් ප්‍රජාව, විෂයමාලාවේ කාලීන වෙනස්කම් පිළිබඳව දැනුවත් කිරීමට ද, විෂයමාලාවේ ඇති ඉහළ කලයේ සංකල්ප පැහැදිලි කිරීමටද, සින්දු, සංගීතය සහ නැටුම් ආදී සෞන්දර්යාත්මක ක්‍රම උපයෝගී කර ගැනීමටද අදාළ විවිධ වැඩසටහන් සකසනු ලැබේ.

2019 වර්ෂය උදෙසා පහත සඳහන් ක්‍රියාකාරකම් සපුරා ඇත.

- ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සාරවත් කිරීම වස් ප්‍රාථමික සහ ද්විතීය අධ්‍යාපන විෂයමාලා මට්ටම් උදෙසා සිංහලෙන් සහ දෙමළ භාෂාවෙන් අමතර ශ්‍රවණ ද්‍රව්‍ය කට්ටල හතලිහක් (40) සැකසීම

- ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය උද්දීපනය කිරීම සඳහා අතිරේක වීඩියෝ ද්‍රව්‍ය කට්ටල විසි තුනක් (23) සැකසීම
- අධ්‍යාපන ශාස්ත්‍රපති වැඩසටහන උදෙසා ශ්‍රව්‍ය වැඩසටහන් පහළොවක් (15) වාර්තා කිරීම
- දහතුන් වසරක සහතික කරන ලද අධ්‍යාපන වැඩසටහන වැඩි දියුණු කිරීම වස් වීඩියෝ වැඩසටහන් දහයක් (10) සම්පාදනය කිරීම
- ජාතික අධ්‍යාපන යූ ටියුබ් චැනලයට වීඩියෝ අන්තර්ගත විස්සක් (20) ගොඩනැගීම සහ වැඩසටහන් හැත්තෑ දෙකක් (72) ඇතුළු කිරීම

6.3 මාර්ගෝපදේශනය සහ උපදේශනය

අධ්‍යාපන ප්‍රජාවගේ මානසික සංකූලතා අවශ්‍යතාවනට මුහුණදීම සඳහා 2006 වර්ෂයේ ජුනි මස මාර්ගෝපදේශන හා උපදේශන ඒකකය පිහිටුවන ලදී. පාසල් සිසු ප්‍රජාවට මාර්ගෝපදේශන සහ උපදේශන සේවාවන් ලබා දීමේ වගකීම මෙම ඒකකය මගින් දරනු ලැබේ. 2019 වර්ෂයේ දී පහත සඳහන් ක්‍රියාකාරකම් සම්පූර්ණ කෙට ඇත.

- පාසල් සිසුන් දහඅට දෙනෙකු (18) සහ එම දෙමාපියන් උදෙසා අභ්‍යන්තර උපදේශන සැසි පවත්වන ලදී.
- වෘත්තීය මාර්ගෝපදේශන උපදේශකයන් සහ පාසල් උපදේශකයන් දෙසිය විසිහතර (224) දෙනෙකු යාවත්කාලීන කරන ලදි.
- වෘත්තීය මාර්ගෝපදේශනය උදෙසා ගුරු මාර්ගෝපදේශකයන් සහ විෂයමාලා කෙටුම්පතක් සකස් කරන ලදී.

6.4 විවෘත ඉගෙනුම්

විවිධ හේතූන් කරනකොට විධිමත් අධ්‍යාපනයක් මගහැරී ගිය කාණ්ඩ උදෙසා, දුරස්ථ අධ්‍යාපන පාඨමාලා පැවැත්වීම අරමුණු කොට ගෙන විවෘත පාසල් ඒකකය පිහිටුවා ඇත. මෙම ක්‍රියාවලිය විවෘත හා දුරස්ථ ක්‍රම උපයෝගී කරගැනීමෙන් අධ්‍යාපනය, ඉගෙනුම ලබන්නා වෙත සමීප කරයි. අධ්‍යාපන සුදුසුකම්, රැකියා හෝ සමාජීය සන්තුෂ්ටිය මේ ආදී දේ නොලසකා මෙම ක්‍රියාවලිය මගින් සැමට අධ්‍යාපන අවස්ථා සැපයීම පුළුල් කිරීමට අපේක්ෂා කෙරේ. විවෘත පාසල් මගින්, ඉගෙනුම් ලබන්නාට ඉගෙනුම ආරම්භ කළ යුත්තේ කවර දිනක ද, කුමන මාදිලියක් අනුගමනය කළ යුතු ද ආදී තීන්දු තීරණ ගැනීම පහසුකරවන අතර, ඕනෑම සුදුසු අවස්ථාවක ඉගෙනුම ආරම්භ කිරීම ද පහසු කරවයි. විවෘත ඉගෙනුම් වැඩසටහන මගින් පහත සඳහන් ක්‍රියාකාරකම් සම්පූර්ණ කොට ඇත.

- විද්‍යාව සහ ගණිතය උගන්වන්නන් සඳහා අමතර පොත් දෙකක් සැකසීම

- සාක්ෂරතා සහ පදනම් පාඨමාලා උගන්වන්නන්ගේ අනුගමනය සඳහා මූලික කරුණු සැකසීම
- සාක්ෂරතා, පදනම් සහ විවෘත ද්විතීය පාඨමාලා උගන්වන්නන් අසූ පස් දෙනෙකු (85) යාවත් කිරීම
- පවතින මධ්‍යස්ථාන ප්‍රතිව්‍යුහගත කිරීමත්, නව ප්‍රාදේශීය මධ්‍යස්ථාන පිහිටුවීමටත් අවශ්‍යතා පරීක්ෂා කිරීම ක්‍රියාවේ යෙදවීම
- වඩමාරච්චි සහ නිසාලි යන ප්‍රාදේශීය මධ්‍යස්ථාන දෙක (02) ප්‍රතිව්‍යුහගත කිරීම
- ඉගෙනුම් ලබන්නන්ට ආධාර සැපයීම වස් මධ්‍යස්ථාන විසිපහක (25) ඉගෙනුම් සැසි හතලිස් දෙකක් (42) ක්‍රියාත්මක කිරීම
- විවෘත පදනම් පාඨමාලාව හාරසිය තිස් දෙනෙකු (430) විසින් ද, සාක්ෂරතා පාඨමාලාව එක්දහස් දෙසිය අසූහත් දෙනෙකු (1287) විසින් ද, විවෘත ද්විතීය පාඨමාලාව (කොටස් වශයෙන්) එක්දහස් තුන්සිය අසූ දෙදෙනෙකුට (1382) විසින් ද නිමා කොට ඇත.
- පදනම් පාඨමාලාව සඳහා හාරසිය පනස් දෙනෙකු (450) ද්විතීය පාඨමාලාව සඳහා හයසිය (600) දෙනෙකු ද, සාක්ෂරතා පාඨමාලාව සඳහා තුන්සිය දෙනෙකු ද (300) 2019 වර්ෂයේ දී බඳවා ගෙන ඇත.

7.0 පර්යේෂණ, සැලසුම් හා සංවර්ධන

ගුණාත්මක අධ්‍යාපනයක් අරමුණු කොට ගෙන ක්‍රියාත්මක වන ආයතනයක් වශයෙන් ජාතික අධ්‍යාපන ආයතනය, විෂයමාලා සංවර්ධනය, වෘත්තීය සංවර්ධනය සහ ප්‍රතිපත්ති සැකසීම පර්යේෂණ හා සැලසුම් ආදිය විවිධ ක්‍රියාකාරකම් මගින් ක්‍රියාවට නංවයි. පර්යේෂණ සැලසුම් හා සංවර්ධන දෙපාර්තමේන්තුව මගින් මේ කටයුතු ක්‍රියාත්මක කෙරේ.

7.1 පර්යේෂණ හා සංවර්ධන

පර්යේෂණ හා සංවර්ධන දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යභාරය වනුයේ, අධ්‍යාපනික පර්යේෂණ ආරම්භ කිරීම, පෘථුල කිරීම, සාකච්ඡා ප්‍රශ්න කිරීම් අවශ්‍යවන අධ්‍යාපනික ගැටළු ආමන්ත්‍රණය කිරීමට වේදිකාවක් සැපයීම, පර්යේෂණ තොරතුරු පැහිරවීමෙන්, ප්‍රදාන ලබා දීමෙන් සහ පාඨමාලා පැවැත්වීමෙන්, අධ්‍යාපන ක්ෂේත්‍රයේ නියුක්ත වූ අයට ඔවුන්ගේ පර්යේෂණ හැකියා වර්ධනය කර ගැනීමට අවස්ථා සැපයීමයි.

2019 වර්ෂය තුළ ලබාගත් කැපී පෙනෙන සාර්ථකත්වයන් පහත සඳහන් වේ.

- 2002 සිට 2013 දක්වා, පවත්වා ඇති ආචාර්ය සී. ඩබ්ලිව්. ඩබ්ලිව්. කන්නන්ගර (සිංහල, දෙමළ, ඉංග්‍රීසි) අනුස්මරණ දේශනයන්හි අවසාන වාර්තාව සැකසීම.

- සඟරා මගින්, පර්යේෂණ සොයාගැනීම් ව්‍යාප්ත කිරීමට විදේශ පර්යේෂණ සඟරාව නිම කිරීම
- 2019 වර්ෂය සඳහා පර්යේෂණ ප්‍රදාන හතරක් (4ක්) ලබා දී ඇත. පර්යේෂණ අධ්‍යයන තුනක (21 පරිච්ඡේද සමාලෝචනය වෙමින් පවතින අතර, ප්‍රතිපත්ති පර්යේෂණ ධෛර්ය කිරීම් වස් ප්‍රදාන ලබාදීමෙන්, පර්යේෂකයින් දිරි ගන්වනු ලැබේ.
- ශ්‍රී ලංකාවේ පාසල් පද්ධතිය තුළ විෂය සමගාමී ක්‍රියාකාරකම් ක්‍රියාත්මක වීමේ ස්වභාවය පිළිබඳ අධ්‍යයනය නිම කිරීම
- හෙට දිනය උදෙසා ජ්‍යෙෂ්ඨ වෘත්තීය විෂයමාලාව නැවත නිර්වචනය කිරීම, යන මාතෘකාව යට, තිස්වන (30) සී. ඩබ්ලිව්. ඩබ්ලිව්. කන්නන්ගර අනුස්මරණ දේශනය, ශ්‍රී ලංකා විවෘත විශ්ව විද්‍යාලයේ ගණිත දෙපාර්තමේන්තුවේ ආචාර්ය උපාලි මාම්පිටිය විසින් පැවැත්වීමට කටයුතු සැලසීම
- 2019 පුවත් හසුන වෙළුම 1 ප්‍රකාශ කොට, පළාත් / කොට්ඨාශ අධ්‍යාපන කාර්යාල, ජාතික අධ්‍යාපන පීඨ සහ ගුරු පුහුණු මධ්‍යස්ථාන වෙත බෙදා හැරීම; පුවත් හසුන වෙළුම 2 මුද්‍රණය සඳහා භාර දීම
- ශ්‍රී ලංකාවේ උසස් පෙළ සිසුන් විෂය ධාරා තෝරා ගැනීම පිළිබඳ අධ්‍යයනයක කෙටුම් පත නිම කිරීම
- "ද්විතීය මට්ටමේ සෞඛ්‍යය කායික අධ්‍යාපන විෂයමාලා අන්තර්ගතය විශ්ලේෂණයක්" නමින් කරන ලද අධ්‍යයනයක කෙටුම්පත් වාර්තාවක් නිම කිරීම

7.2 සැලසුම් හා ඇගයීම්

- ජාතික ඉලක්ක සමඟ අනුගතව ජාතික අධ්‍යාපනආයතනයේ අරමුණු සහ ඉලක්ක ක්ෂාත් ක්ෂාත් කර ගැනීම උදෙසා ද,
- ආයතනය සතු මානව හා භෞතික සම්පත් ද කාර්යක්ෂම හා ඵලදායී ආකාරයෙන් උපයෝගී කර ගැනීම සඳහාද 2019 වර්ෂය අවසානය වන විට පහත සඳහන් කාර්යයන් නිමා කොට ඇත.
- 2018 වර්ෂයේ වාර්ෂික ප්‍රගති වාර්තාව සැකසීම
- 2020 - 2024 පස් අවුරුදු උපාය මෙහෙයුම් සැලැස්ම සැකසීම
- 2020 වර්ෂය සඳහා, වාර්ෂික සැලසුම් ක්‍රියාත්මක කිරීම, වාර්ෂික අයවැය, අයවැය ඇස්තමේන්තු සැලසීම
- 2019 වර්ෂය තුළ විදේශීය සහ දේශීය මූල්‍ය ආධාර යටතේ ක්‍රියාත්මක කරන ලද කාර්යභාරයන් පිළිබඳ ත්‍රෛමාසික ප්‍රගති වාර්තා හතරක් (04) සැකසීම

- වෙනත් ආයතන විසින් ඉල්ලුම් කරන ලද පහත සඳහන් ප්‍රගති වාර්තා සැකසීම
  - මහ බැංකුවට ඉදිරිපත් කිරීමට ප්‍රගති වාර්තා දෙකක් (02)
  - රාජ්‍ය භාණ්ඩාගාරයට ඉදිරිපත් කිරීමට ප්‍රගති වාර්තා හතරක් (04)
  - යුනිසෙෆ් සහ අධ්‍යාපන අමාත්‍යාංශය සමඟ විදේශීය මූල්‍යාධාර යටතේ ක්‍රියාත්මක වන ආයතන සඳහා ත්‍රෛමාසික ප්‍රගති වාර්තා හතරක් (04) සැකසීම
- දහතුන් වසරක සහතික කරන ලද අධ්‍යාපන වැඩසටහන සම්බන්ධීකරණය

8.0 පරිපාලන මූල්‍ය සහ සහාය සේවා

පරිපාලන මූල්‍ය සහ සහාය සේවා අංශයේ කාර්යභාරය වනුයේ ආයතනයේ අධ්‍යයන පිය පහට අදාළ ක්‍රියාකාරීත්වය උදෙසා මූල්‍ය, භෞතික සහ කළමනාකරණ සහාය සේවා ලබා ගැනීමයි.

8.1 පරිපාලන දෙපාර්තමේන්තුව

පරිපාලන, මූල්‍ය සහ සහාය සේවා අංශය යටතේ ඇති පරිපාලන දෙපාර්තමේන්තුව, එදිනෙදා පරිපාලනයට අදාළ සියළු කටයුතු සම්බන්ධයෙන් ද දේශීය මට්ටමට අවශ්‍ය පුහුණුව සැලසීම සම්බන්ධයෙන් ද, කාර්ය මණ්ඩල වලට අවශ්‍ය පුහුණුව සම්බන්ධයෙන් ද සියළු කාර්යයන් පිළිබඳ වගකීම් උසුලයි.

2019 වර්ෂයේ ජනවාරි සිට දෙසැම්බර් දක්වා, පහත සඳහන් බඳවා ගැනීම් සහ උසස් වීම්, පරිපාලන දෙපාර්තමේන්තුව විසින් සම්පූර්ණ කරන ලදී.

බඳවා ගැනීම්

සැපයුම් නිලධාරි	01
සහකාර කථිකාචාර්ය	36
සහකාර අධ්‍යක්ෂ (මුදල්)	01
පොත් තබන්නන්	01
කළමනාකරණ සහකාර	38
රියදුරු	05
කාර්යාල සහායක	08
කම්කරු	03

උසස්වීම්

අධ්‍යක්ෂ	08
ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය	15

- ඔවුන් විසින් ඉල්ලුම් කරන ලද අධ්‍යයන වැඩසටහන්වලට සහභාගිවීම සඳහා ආයතනයේ අධ්‍යයන සහ අනධ්‍යයන නිලධාරීන් තිස් පස් දෙනෙකුට (35) මූල්‍ය ආධාරත් අධ්‍යයන නිවාඩුත් සලයන ලදී.

8.2 මූල්‍ය දෙපාර්තමේන්තුව

මූල්‍ය දෙපාර්තමේන්තුව මගින් ආයතනයේ සියළු කාර්යයන් උදෙසා අවශ්‍ය මූල්‍ය සම්පත් සැපයීම ද, මූල්‍ය නීති රීති රෙගුලාසි අනුව ආයතනයේ අයවැය වාර්තා පවත්වා ගෙන යාම ද ඉටු කෙරේ.

- ස්ථාවර වත්කම් ලේඛනයේ 80%ක් සකසා නිම කිරීම
- 2018 වර්ෂය සඳහා භාණ්ඩ සම්ක්ෂණය නිම කිරීම
- 2018 වර්ෂයට අදාළ අවසන් මූල්‍ය ප්‍රකාශය සකසා, විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීම

8.3 ඉංජිනේරු සේවා සහ නඩත්තු දෙපාර්තමේන්තුව

ආයතනයේ ගොඩනැගිලි ඉදි කිරීම, නඩත්තු කිරීම, විදුලි සහ දුරකථන සේවා නඩත්තු කිරීම, යටිතල පහසුකම් සැපයීම, පවිත්‍රතා සහ ආරක්ෂක සේවා සම්බන්ධීකරණය, ආදී අධ්‍යාපන කටයුතු උදෙසා අවශ්‍ය භෞතික පරිසරයක් පවත්වා ගෙන යෑමේ වගකීම, ඉංජිනේරු සේවා සහ නඩත්තු දෙපාර්තමේන්තුව විසින් උසුලනු ලැබේ.

2019 වර්ෂය තුළ ඉංජිනේරු සේවාවන්ට අදාළ පහත සඳහන් කාර්යයන් නිම කොට ඇත.

- ජාතික අධ්‍යාපන ආයතන පරිශ්‍රයේ පස් මහල් ගොඩනැගිල්ල නිම කිරීම
- මීපේ තෙමහල් නේවාසිකාගාරය ඉදිවෙමින් පවතී
- ජාතික අධ්‍යාපන ආයතන හා මීපේ පරිශ්‍රයන්හි පුනරුත්ථාපන කටයුතු 25කනිමාව
- මහරගම හා මීපේ ජාශ්‍රයන්හි විදුලිය සැපයීම සහ විහිදුම් ප්‍රගතිය යටතේ කාර්යභාර දෙකක් සහ තවත් එකක් නිම කිරීම
- පරිපත, යන්ත්‍රෝපකරණ පුනරුත්ථාපන ප්‍රගතියට අදාළ කාර්යභාර හතක් සහ දෙකක් නිම කිරීම

8.4 පුස්තකාල

ජාතික අධ්‍යාපන ආයතනයේ පුස්තකාලය ආයතනයේ අභ්‍යන්තර කාර්ය මණ්ඩල සාමාජිකයන්ට අමතරව, විශ්ව විද්‍යාල කාර්ය මණ්ඩල, ජාතික අධ්‍යාපන පීඨ සහ ගුරු අභ්‍යාස විද්‍යාල කාර්ය මණ්ඩල, ගුරුවරුන් සිසුන් සහ තවත් බොහෝ අධ්‍යාපනඥයින් විසින්, අධ්‍යාපන අවශ්‍යතා උදෙසා නිතර පරිහරණය කරනු ලැබේ.

2019 වර්ෂයේ දී පහත සඳහන් පොත් සහ සංයුක්ත තැටි පුස්තකාලයට ලබා දී ඇත.

පොත්	515
පොත් (ප්‍රදාන)	198
විෂයමාලා ද්‍රව්‍ය	27
අධ්‍යාපන වාර්තා	119
දේශීය සඟරා (ප්‍රදාන)	20
විදේශීය (සඟරා) ප්‍රදාන	15
විදේශීය සඟරා	06
ජා.අ.ආ එකතුව	102
පුවත් සඟරා	05
වීඩියෝ සංගත තැටි / සංයුක්ත තැටි (DVD / CD)	17

8.5 මුද්‍රණ හා ප්‍රකාශන

ආයතනයේ මුද්‍රණ හා ප්‍රකාශන දෙපාර්තමේන්තුව මගින් පහත සඳහන් ප්‍රකාශන 2019 වර්ෂයේ දී නිම කර ඇත.

- ගුරු මාර්ගෝපදේශ 04
- විෂය නිර්දේශ හා මොඩියුල 11
- සම්පත් පොත් 61
- සහතික 19
- ආරාධනා පත්‍ර 05
- වෙනත් දෑ (පුස්තකාල පත්, විගණන ලේඛන ආදිය) 59

ඉහත සඳහනට අමතරව, පොත් ප්‍රදර්ශන හතරකට (04) සහභාගි වී ඇත. විෂයමාලා සංවර්ධනයට අදාළ ලේඛන සහ ජාතික අධ්‍යාපන ආයතන ප්‍රකාශ දිරි ගැන්වීමේ අවස්ථා ද ලබා ඇත.

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය எனது இல. My No. } ඊඩබ්ලිව්/සී/එන්අයිඊ/එෆ්ඒ/1/19 ඔබේ අංකය உமது இல. Your No. } දිනය திகதி Date } 2020 සැප්තැම්බර් 21 දින

අධ්‍යක්ෂ ජනරාල්

ජාතික අධ්‍යාපන ආයතනය

ජාතික අධ්‍යාපන ආයතනයේ 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව **2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව**

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

ජාතික අධ්‍යාපන ආයතනයේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, ආයතනයේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

(අ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 01 ප්‍රකාරව ආදායම් හා වියදම් හිලව් නොකළ යුතු වුවද සමාලෝචිත වර්ෂයේදී වියදමට හිලවකල ආදායම රු. 840,299 ක් විය.

(ආ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 02 හි නියමයන්ට අනුකූලව පාරිතෝෂික වෙන් කිරීම රු. 72,000 ක් , වත්කම් විකිණීමෙන් ලද මුදල රු.2,023,600 ක් හා වත්කම් ඉවත් කිරීමේ ලාභය රු. 840,299 ක් මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ නියමිත පරිදි දක්වා නොතිබුණි. එසේම මුදල් ප්‍රවාහ ප්‍රකාශයෙහි ගැලපිලි යටතේ රු.2,733,570 ක් දක්වා තිබුණ ද ඒ සඳහා උපලේඛනයක් විගණනයට ඉදිරිපත් නොකෙරුණි.

(ඇ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 07 හි විධිවිධාන වලට අනුව වත්කම් ප්‍රත්‍යාගණනය කරන විට අදාල වත්කම් පංතියම ප්‍රත්‍යාගණනය කල යුතු වුවත් ඊට පටහැනිව වාහන ප්‍රත්‍යාගණනයේදී පිරිවැය රු.14,600,000 ක් වූ වාහන 04 ක් ප්‍රත්‍යාගණනය කර නොතිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂයේදී කල් පිරී තිබුණු භාණ්ඩාගාර බිල්පත්වල ආයෝජනය කල රු.19,826,596 ක මුදල ආයෝජන අදායමක් ලෙස ගිණුම් ගත කර නිබීම නිසා සමාලෝචිත වර්ෂයේ ඌනතාවය එම ප්‍රමාණයෙන් අඩුවෙන් මූල්‍ය ප්‍රකාශනවල දැක්වුණි.

(ඉ) සමාලෝචිත වර්ෂයේදී අධ්‍යාපන අමාත්‍යාංශයෙන් ලැබුණු රු.103,041,957 ක ප්‍රාග්ධන ප්‍රදාන පුනරාවර්තන ආදායම් ලෙස ගිණුම් ගතකර තිබුණි. මෙම නිසා ආයතනයේ සමාලෝචිත වර්ෂයේ ඌනතාවය එම ප්‍රමාණයෙන් අඩුවෙන් මූල්‍ය ප්‍රකාශනවල දැක්වුණි.

(ඊ) පසුගිය වර්ෂය අවසානයේදී සිදුකල වත්කම් ප්‍රත්‍යාගණනයට අදාල ප්‍රත්‍යාගණන අතිරික්තය රු.521,244 ක් අඩුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ගලපා තිබීම නිසා ප්‍රත්‍යාගණන සංචිතය එම ප්‍රමාණයෙන් අඩුවෙන් මූල්‍ය ප්‍රකාශන වල දැක්වුණි.

(උ) මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණු තොග වටිනාකම හා ඊට අදාල උපලේඛන අනුව වූ තොග වටිනාකම අතර රු.735,592 ක වෙනසක් නිරීක්ෂණය වුව ද එකී වෙනසට හේතු හඳුනාගෙන අවශ්‍ය ගැලපිලි කිරීමට කටයුතු කර නොතිබුණි.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ

මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, ආයතනය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය, ආයතනය ඇවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් කැබීම හා ආයතනයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

ආයතනයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, ආයතනයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑමවිටම ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බවට අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මහඟරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදු වන්නා වූ බලපෑම් ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම් හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම් වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස ආයතනයේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- භාවිතා කරන ලද ගිණුම්කරන ප්‍රතිපත්තිවල සහ ගිණුම්කරන ඇස්තමේන්තු වල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල යෝග්‍යතාවය අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබෙද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කිරීම, ව්‍යුහය සහ අන්තර්ගතය ඇගයීමට ලක්කල අතර ඒ සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදී.

2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ .

- 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවන් අනුව, මාගේ වාර්තාවේ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලද අතර, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට නිසි මූල්‍ය වාර්තා ආයතනය පවත්වාගෙන ගොස් තිබුණි.

- 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (III) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ආයතනය ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

- 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මෙම වාර්තාවේ 1.2 (ඊ) සහ (උ) යන ඡේද වල ඇතුළත් නිරීක්ෂණයන් හැර මා විසින් සිදු කරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

  අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම තුල, පහත සඳහන් ප්‍රකාශ කිරීමට, තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවීය.

  - 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (ඇ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ආයතනයේ පාලක මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට ආයතනය සම්බන්ධවී යම් ගිවිසුමක් සම්බන්ධයෙන් සෘජුව හෝ අන්‍යාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව.
  - 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර යම් අදාල ලිඛිත නීතියකට හෝ ආයතනයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව.

නීතිරීති / විධානයට යොමුව	විස්තරය
(අ) 1985 අංක 28 දරන ජාතික අධ්‍යාපන පනතේ 4 (ක) සහ 28 වගන්ති	ආයතනයේ පරිපාලන හා මූල්‍ය රෙගුලාසි සංග්‍රහය පනතේ විධිවිධාන ප්‍රකාරව අනුමත කරගෙන නොතිබුණි.
(ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය	
(i) II වැනි පරිවිජේදයේ 13.3 වගන්තිය	ආයතන සංග්‍රහයේ විධිවිධානවලට පටහැනිව නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් තනතුරක් , අධ්‍යක්ෂ තනතුරු දෙකක් සහ මුදල් අයකැමි තනතුරක් සඳහා 2015,2016,2018 සහ 2019 වර්ෂ වලදී වැඩ බැලීමේ පත්වීම් ලබාදී දීමනා ලෙස සමාලෝචිත වර්ෂයේදී රු. 478,128 ක් ගෙවා තිබුණි.
(ii) VIII වැනි පරිවිජේදයේ 6.1 වගන්තිය	මාසික ඒකාබද්ධ වැටුප (දීමනා හැර) පදනම් කරගෙන අතිකාල ගෙවීම් රේට ගණන් බැලිය යුතු වුවත් 1995 මාර්තු 22 දිනැති අංක ඩී/එස්/811/617/94 දරන සහකාර කම්කරු කොමසාරිස්වරයෙකුගේ උපදෙස් ලිපියක් පදනම් කරගෙන 2016 වර්ෂයේ සිට දළ වැටුප පදනම් කරගෙන අතිකාල දීමනා ගණනය කර සමාලෝචිත වර්ෂය සඳහා රු.37,226,200 ක් අතිකාල දීමනා ගෙවා තිබුණු නමුත් අතිකාල දීමනා ගෙවීමට පදනම් කර ගන්නා වැටුප ආයතනයේ පරිපාලන හා මූල්‍ය රෙගුලාසි සංග්‍රහයට ඇතුළත් කර විධිමත් පරිදි අනුමත කර ගැනීමට කටයුතු කර නොතිබුණි.
(ඇ) භාණ්ඩාගාරයේ කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව මගින් 2013 වර්ෂයේදී ආයතනය සඳහා අනුමත කර ඇති අංක 257 දරන චක්‍රලේඛය	චක්‍රලේඛ විධිවිධාන වලට පටහැනිව 2014 සිට 2018 වර්ෂය දක්වා නිලධාරීන් 89 දෙනෙකුට රු.6,786,256 ක් ද සමාලෝචිත වර්ෂයේදී නිලධාරීන් 09 දෙනෙකුට රු.505,915 ක් ද දීමනා වශයෙන් වැඩිපුර ගෙවා තිබුණද ඒ සඳහා භාණ්ඩාගාර අනුමැතිය ලබාගෙන නොතිබුණි.

(ඉ)	2010 සැප්තැම්බර් 06 දිනැති අංක 19 සහ 2017 මාර්තු 15 දිනැති අංක 33 දරන අතිරේකයන්ගෙන් සංශෝධිත රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 9.3.1 (ආ) වගන්තිය	රු.200,000 ට වැඩි වාහන අළුත් වැඩියා සඳහා රේඛීය අමාත්‍යාංශ ලේකම්ගෙන් අනුමැතිය ලබා ගත යුතු වුවද සමාලෝචිත වර්ෂයේදී අවස්ථා 07 ක දී අමාත්‍යාංශ ලේකම්ගේ අනුමැතියකින් තොරව වාහන අළුත් වැඩියා සඳහා රු.2,861,623 ක් ගෙවා තිබුණි.

- 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ආයතනයේ බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව.

- 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ආයතනයේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ අදාළ නීතිරීති වලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර නොමැති බව.

3. අනෙකුත් විගණන නිරීක්ෂණ

(අ) උසස් පෙළ තාක්ෂණවේදය විෂය සඳහා බඳවා ගන්නා ඩිප්ලෝමාධාරී ගුරුවරුන් සඳහා පැවැත්වෙන අධ්‍යාපනවේදී (ඉංජිනේරු තාක්ෂණවේදය) උපාධි පාඨමාලාවේ ශාස්ත්‍රීය විෂයයන්ට අදාල දේශන හා ප්‍රායෝගික සැසි පැවැත්වීම වෘත්තීය තාක්ෂණික විශ්ව විද්‍යාලයට දෙපාර්ශවය අතර ඇති කර ගත් අවබෝධතා ගිවිසුමකින් තොරව 2015 වර්ෂයේ පවරා තිබුණ ද 2017 වර්ෂයේදී එම ආයතනය දේශන පැවැත්වීමෙන් ඉවත් වී තිබුණි. මෙම නිසා ගුරු සිසුන් 211 ක් විශ්ව විද්‍යාල 04 කට යොමු කර පාඨමාලා ගාස්තු වශයෙන් රු.52,444,398 ක් එම විශ්ව විද්‍යාල වලට ගෙවා තිබුණ ද දෙපාර්ශවයන් අතර ගිවිසුම් අත්සන් කර නොතිබුණි.

(ආ) පාඨමාලා සම්පූර්ණකර නොතිබූ ගුරු සිසුන් 96 දෙනෙකු වෙනුවෙන් පාඨමාලා ගාස්තු ලෙස විශ්ව විද්‍යාල 04 ට රු.22,644,843 ක් ගෙවා තිබුණ ද පාඨමාලා හැරගිය ගුරු සිසුන් සමඟ ගිවිසුමකට එළඹීමට ආයතනය කටයුතු කර නොතිබීම නිසා ඔවුන් සඳහා වැය කල මුදල් නැවත අය කර ගැනීමට නොහැකි වී තිබුණි.

(ඇ) 2009 වර්ෂයේ සිට 2011 වර්ෂය දක්වා කාලය තුල නිලධාරීන් 131 දෙනෙකුට වැඩිපුර ගෙවා තිබුණු රු.2,345,269 ක වැටුප් සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) වර්ෂ 05 කට වැඩි කාලයක සිට ඉදිරියට ගෙන එමින් පැවැති ආපසු ගෙවිය යුතු තැන්පතු රු.1,887,031 ක් නිරවුල් කිරීමට හෝ වගකීම් කාලය ඉකුත් වූ තැන්පතු ආදායමට ලියා හැරීමට හෝ කටයුතු කර නොතිබුණි.

(ඉ) 2006 වර්ෂයේ සිට 2015 දක්වා කාලයට අදාල ගෙවිය යුතු අර්ථසාධක මුදල් සහ අධිභාර මුදල රු.68,757,865 ක් සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් නිරවුල් කර නොතිබුණි.

(ඊ) අයවැය ගත පුනරාවර්තන වියදම් තථ්‍ය වියදම් සමග සැසඳීමේදී සියයට 3.9 සිට සියයට 264.3 දක්වා පරාසයක විචලනයන් නිරීක්ෂණය වුයෙන් අය වැය ලේඛනය ඵලදායී කළමණාකරන පාලන කාරකයක් ලෙස උපයෝගී කරගෙන නොතිබුණු බව නිරීක්ෂණය විය.

(උ) 2008 වර්ෂයට පෙර සිට පවතින රු.45,034,652 ක පුස්තකාල පොත් සම්බන්ධයෙන් භෞතික සත්‍යාපනයක් කර නොතිබුණු අතර එවායේ උපලේඛනයක් ද විගණනයට ඉදිරිපත් නොකෙරුණි.

(ඌ) සමාලෝචිත වර්ෂය අවසානයට ආයතනයේ අනුමත කාර්ය මණ්ඩලය 652 ක් වුව ද තථ්‍ය කාර්ය මණ්ඩලය 493 ක් වුයෙන් පුරප්පාඩු 159 ක් පැවතිණි. එසේ වුවත් එම පුරප්පාඩු සම්පූර්ණ කිරීම සඳහා සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් කටයුතු කර නොතිබුණි.

(එ) මීපේ දකුණු ආසියානු ගුරු සංවර්ධන මධ්‍යස්ථානයේ නේවාසිකාගාරය ඉදිකිරීමට අදාළ 2018 පෙබරවාරි 20 දිනැති කොන්ත්‍රාත් ගිවිසුම ප්‍රකාරව වසරක කොන්ත්‍රාත් කාලය අධ්‍යාපන අමාත්‍යාංශයේ අධ්‍යක්ෂ (පාසැල් ගොඩනැගිලි) විසින් 2019 දෙසැම්බර් 15 දින දක්වා දීර්ඝ කර තිබුණ ද රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 8.14.1 වගන්තිය ප්‍රකාරව කොන්ත්‍රාත්තුවේ ප්‍රමාදය සිදු වුයේ කොන්ත්‍රාත්කරුගේ පාලනයෙන් බැහැර වූ හේතුවක් නිසා බව තහවුරු කර ගෙන නොතිබුණු අතර 2020 ජුනි 30 දින වන විටත් කොන්ත්‍රාත්තුව අවසන් කර නොතිබුණි.

ඩබ්ලිව්.පී.සී.වික්‍රමරත්න
විගණකාධිපති

ජාතික අධ්‍යාපන ආයතනයේ 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාවට අදාළ පැහැදිලි කිරීම් වාර්තාව

1.2. තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

(අ) 2020 වර්ෂයට අදාළ අවසන් ගිණුම් පිළියෙල කිරීමේ දී ප්‍රමිතියේ දැක්වෙන ආකාරයට 2019 යලි ප්‍රකාශිත (Restated) කරනු ලබන මූල්‍ය ප්‍රකාශන තුල මෙම වරද නිවැරදි කිරීමට කටයුතු කරනු ලැබේ.
ගිණුම්කරණ ප්‍රමිතියට අනුකූලව කටයුතු කිරීමට නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (පාලන මුදල් හා සහාය සේවා) විසින් නියෝජ්‍ය අධ්‍යක්ෂ (මුදල්), සහකාර අධ්‍යක්ෂ (මුදල්) සහ පොත් තබන්නන් වෙත ලිඛිතව උපදෙස් ලබා දී ඇත.

විගණන හා කළමනාකරණ කමිටු නිර්දේශය

ඉහත පිළිතුර සමඟ කමිටුව එකඟ වන ලදී.

(ආ) අතපසුවීමකින් පාරිතෝෂික වියදම් වෙන් කිරීම් රු 72,000 /- ක් මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ අඩුවෙන් සටහන්වී ඇති අතර 2020 වර්ෂයට අදාළ අවසන් ගිණුම් පිළියෙල කිරීමේ දී 2019 යලි ප්‍රකාශිත (Restated) කරනු ලබන මූල්‍ය ප්‍රකාශනවල එය නිවැරදි කිරීමට කටයුතු කරනු ලැබේ.

වත්කම් ඉවත් කිරීමෙන් ලද මුදල වන රු.2,023,600/- මුදල් ප්‍රවාහය, ආයෝජන ක්‍රියාකාරකම් වලින් ලද මුදල් යටතේ 2020 වර්ෂයට අදාළ අවසන් ගිණුම් පිළියෙල කිරීමේ දී 2019 යලි ප්‍රකාශිත (Restated) කරනු ලබන මූල්‍ය ප්‍රකාශනවල නිවැරදිව දැක්වීමට කටයුතු කරනු ලැබේ.

අතපසුවීමකින් වත්කම් විකිණීමෙන් සිදුවූ ලාභය වන රු.840,299/- ක මුදල මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ දක්වා නොතිබීම, 2020 වර්ෂයට අදාළ අවසන් ගිණුම් පිළියෙල කිරීමේ දී 2019 යලි ප්‍රකාශිත (Restated) කරනු ලබන මූල්‍ය ප්‍රකාශන තුළ නිවැරදි කිරීමට කටයුතු කරනු ලැබේ.

2018 වර්ෂයේ අවසන් ගිණුම්වල මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ අනෙකුත් ගැලපීම් (Other adjustments) ලෙස දක්වා තිබූ රු 80,632,824/85 ක මුදල 2019 වර්ෂයේ අවසන් ගිණුම් පිළියෙළ කිරීමේදී නිසි පරිදි සැසඳීම් කිරීමෙන් පසුවත් රු.2,733,570/12 ක් වෙනත් ගැළපීම් ලෙස අවසන් ගිණුම් තුළ දක්වා ඇත.එම අගය ද තවදුරටත් සැසඳීම් කිරීමෙන් පසු 2020 වර්ෂයට අදාළ අවසන් ගිණුම් පිළියෙල කිරීමේ දී 2019 යලි ප්‍රකාශිත (Restated) කරනු ලබන මූල්‍ය ප්‍රකාශන තුළ නිවැරදි කිරීමට කටයුතු කරනු ලැබේ.

ගිණුම්කරණ ප්‍රමිතියට අනුකූලව කටයුතු කිරීමට නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (පාලන මුදල් හා සහාය සේවා) විසින් නියෝජ්‍ය අධ්‍යක්ෂ (මුදල්), සහකාර අධ්‍යක්ෂ (මුදල්) සහ පොත් තබන්නන් වෙත ලිඛිතව උපදෙස් ලබා දී ඇත.

විගණන හා කළමනාකරණ කමිටු නිර්දේශය

අතපසුවීමකින් සිදුවන වැරදි පිළිගත නොහැකි අතර මූල්‍ය අංශය විසින් වගකීමෙන් වැඩ කරන බව නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (පාලන මුදල් හා සහාය සේවා) විසින් තහවුරු කර ගත යුතුය. තව ද ගිණුම්කරණ ප්‍රමිත සම්බන්ධ දැනුම පුහුණු වැඩසටහන් හරහා ලබා දීම සුදුසු ය.

(ඇ) ස්ථාවර වත්කම් ප්‍රත්‍යාගණනය සිදු කරනු ලැබූ දිනය වන 2018/12/31 වන දිනට මෙම වාහන 04 අලුත්වැඩියා කටයුතු සඳහා ගරාජයන් වෙත යොමුකර තිබූ අතර එම වාහන Dismantle තත්ත්වයේ පැවතුණි. වාහන නිරීක්ෂණය කරනු ලැබූ ප්‍රත්‍යාගණන කටයුතු මෙහෙය වූ ආයතනය වන දසනායක සහ සමාගම එම වාහන සඳහා සාධාරණ අගයක් (Fair Value) ලබාදීම අපහසු බව දන්වා සිටින ලදී. ඒ අනුව එම වාහන හතර (04) 2018.12.31 දිනට ප්‍රත්‍යාගණනය සඳහා යොදා ගත නොහැකි විය.මෙම වාහන හතරෙන් වාහන 02ක් අලුත්වැඩියා කටයුතු අවසන් වීමෙන් පසු 2019/12/26 වන දිනට ප්‍රත්‍යාගණනය සිදුකර ඇති අතර 2020 වර්ෂයට අදාළ අවසන් ගිණුම් පිළියෙල කිරීමේ දී 2019 යලි ප්‍රකාශිත (Restated) කරනු ලබන මූල්‍ය ප්‍රකාශනවල නිවැරදි කිරීමට කටයුතු කරනු ලබන අතර ඉතිරි වාහන දෙක. 2020 වර්ෂයේදී ගිණුම් ගත කිරීමට කටයුතු කරනු ලැබේ.

ප්‍රත්‍යාගණන ආයතනය වෙතින් අදාළ ප්‍රත්‍යාගණන කටයුතු සිදු කරවා ගෙන ගිණුම්කරණ ප්‍රමිතියට අනුකූලව අවසන් ගිණුම් වල අවශ්‍ය ගැලපීම් සිදු කිරීමට නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (පාලන මුදල් හා සහාය සේවා) විසින් නියෝජ්‍ය අධ්‍යක්ෂ (මුදල්), සහකාර අධ්‍යක්ෂ (මුදල්) සහ පොත් තබන්නන් වෙත ලිඛිතව උපදෙස් ලබා දී ඇත.

විගණන හා කළමනාකරණ කමිටු නිර්දේශය

දක්වා ඇති කරුණු පිළිගත නොහැකි අතර ගිණුම්කරණ ප්‍රමිත අනුව කටයුතු කළ යුතුය. මේ ආකාරයේ ප්‍රධාන අපගමනයන් පවතී නම් එය මූල්‍ය ප්‍රකාශනවල සටහනක් මඟින් ඉදිරිපත් කළ යුතුය.

(ඈ) සමාලෝචිත වර්ෂය තුල භාණ්ඩාගාර බිල්පත් කල් පිරීමෙන් ලද ආයෝජිත මුදල අතපසුවීමකින් භාණ්ඩාගාර බිල්පත් පොළී ආදායම් ගිණුමට බැර කිරීමෙන් සිදු වූ වරද 2020 වර්ෂයට අදාළ අවසන් ගිණුම් පිළියෙල කිරීමේ දී 2019 යලි ප්‍රකාශිත (Restated) කරනු ලබන මූල්‍ය ප්‍රකාශන තුල නිවැරදි කිරීමට කටයුතු කරනු ලැබේ.

වර්ෂයේ ආදායම නිවැරදිව හඳුනා ගැනීමටත් මෙවැනි ගිණුම්කරණ අඩුපාඩු නැවත ඇති නොවන පරිදි කටයුතු කිරීමටත් නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (පාලන මුදල් හා සහාය සේවා) විසින් නියෝජ්‍ය අධ්‍යක්ෂ (මුදල්), සහකාර අධ්‍යක්ෂ (මුදල්) සහ පොත් තබන්නන් වෙත ලිඛිතව උපදෙස් ලබා දී ඇත.

විගණන හා කළමනාකරණ කමිටු නිර්දේශය

නිවැරදිව ගණනය කර තිබේ ද යන්න තහවුරු කර ගැනීම අවශ්‍ය හෙයින් නැවත පරීක්ෂා කිරීමේ වගකීම මුදල් අංශයේ නිළධාරියෙකු වෙත පැවරීම.

(ඉ) දක්වා ඇති ශීර්ෂය යටතේ 2019 වර්ෂය වෙනුවෙන් අධ්‍යාපන අමාත්‍යාංශය යටතේ ලැබුණු ප්‍රාග්ධන ප්‍රදාන, අධ්‍යාපන අමාත්‍යාංශයේ ප්‍රාග්ධන වැය ශීර්ෂයෙන් ලබා දුන්න ද ජාතික අධ්‍යාපන ආයතනයේ අයවැය ලේඛනයට ඒදාළව පුනරාවර්තන ආදායම් ලෙස ඇස්තමේන්තු ගත කර ඇත. 2018 වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන විගණනයේ දී ද මේ පිළිබඳ විමසු නිසා මේ පිළිබඳව අධ්‍යාපන අමාත්‍යාංශයේ ප්‍රධාන ගණකාධිකාරීගෙන් ලිඛිතව විමසු අතර ඔහු දන්වා ඇත්තේ එම ප්‍රාග්ධන ප්‍රදාන අධ්‍යාපන අමාත්‍යාංශ ප්‍රාග්ධන වැය ශීර්ෂයෙන් ලබා දෙන බැවින් ඒවා පුනරාවර්තන වැය ශීර්ෂයෙන් ලබා දිය නොහැකි බවයි (ඇමුණුම -01).

මානව ප්‍රාග්ධන සංවර්ධනය යටතේ ප්‍රාග්ධන වියදමක් සේ සලකා අයවැය ලේඛනයට ඇතුලත් කර ගිණුම්ගත කිරීමට 2021 වසරේ සිට කටයුතු කරනු ලැබේ.

අයවැය ලේඛනය සකස් කිරීමේදී මේ පිළිබඳව අවධානය යොමු කර අවශ්‍ය පියවර ගැනීමට කටයුතු කරනු ලැබේ.

විගණන හා කළමනාකරණ කමිටු නිර්දේශය

අධ්‍යාපන අමාත්‍යාංශය සමඟ සාකච්ඡා කර මෙම ගැටළුව විසඳීම.

(ඊ) 2018.12.31 දිනට සිදු කරන ලද වත්කම් ප්‍රත්‍යාගණනයට අනුව ස්ථාවර වත්කම් වල ප්‍රත්‍යාගණිත අගය රු. 6,025,155,050/- කි. එදිනට ස්ථාවර වත්කම් වල ශුද්ධ අගය රු. 779,961,878/- කි. මේ අනුව ප්‍රත්‍යාගණන අතිරික්තය රු. 5,245,193,172/- කි. (රු. 6,025,155,050/- - රු. 779,961,878/-) ප්‍රත්‍යාගණන අතිරික්ත මුදල රු.5,245,193,171/41 බවට 2019 මූල්‍ය ප්‍රකාශන වාර්තාවේ ගිණුම්කරණ ප්‍රතිපත්ති මඟින් හෙළිදරව් කර ඇත (පිටුව 4).

ගිණුම් වාර්තාවේ සටහන් අංක 16 සංචිත අරමුදල් යටතේ මෙම ප්‍රත්‍යාගණන අතිරික්තය නිවැරදිව ගලපා ඇත.(රු.219,484,165/20+රු.5,245,193,171/41= රු. 5,464,677,336/61) (ගිණුම් අංක 330).

2019 වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන තුළ හිමිකම් වෙනස්වීම් ප්‍රකාශයේ ප්‍රත්‍යාගණන අතිරික්තය හා අනෙකුත් වෙන්කිරීම් ශීර්ෂය යටතේ 2018 වර්ෂයට අදාළ ප්‍රත්‍යාගණන අතිරික්තය වන රු. 5,245,193,172/- මුදල සහ අනෙකුත් වෙන් කිරීම් වන පර්යේෂණ හා සංවර්ධන වෙන්කිරීමට අදාළ රු. 1,000,000/- සෘණ ශේෂය ද ගලපා තිබීම හේතුවෙන් මෙලෙස දක්වා ඇත.

මෙවැනි අඩුපාඩු ඇති නොවන පරිදි කටයුතු කිරීමට නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (පාලන මුදල් හා සහාය සේවා) විසින් නියෝජ්‍ය අධ්‍යක්ෂ (මුදල්), සහකාර අධ්‍යක්ෂ (මුදල්) සහ පොත් තබන්නන් වෙත ලිඛිතව උපදෙස් ලබා දී ඇත.

විගණන හා කළමනාකරණ කමිටු නිර්දේශය

ඉහත පිළිතුර සමඟ කමිටුව එකඟ වන ලදී.

(උ) පසුගිය කාලයට අදාළ තොරතුරු සොයා මෙම ගිණුම සැසඳීමට කටයුතු කරනු ලැබේ.
අදාළ නිවැරදි කිරීම් සිදු කිරීමට නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (පාලන මුදල් හා සහාය සේවා) විසින් නියෝජ්‍ය අධ්‍යක්ෂ (මුදල්), සහකාර අධ්‍යක්ෂ (මුදල්) සහ පොත් තබන්නන් වෙත ලිඛිතව උපදෙස් ලබා දී ඇත.

විගණන හා කළමනාකරණ කමිටු නිර්දේශය

සැසඳුම් ලේඛනය මීළඟ විගණන හා කළමනාකරණ කමිටුව වෙත ඉදිරිපත් කිරීම.

2. **වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව**

(අ) **1985 අංක 28 දරන ජාතික අධ්‍යාපන ආයතන පනතේ 4 (ක) සහ 28 වගන්ති**

දැනට පවතින පරිපාලන හා මූල්‍ය රෙගුලාසි සංග්‍රහය පවතින නීති රීති රෙගුලාසි වලට අනුකූලව යාවත්කාලීන කිරීම සඳහා කමිටුවක් පත් කර ඇති අතර එම සංශෝධිත පරිපාලන හා මූල්‍ය රෙගුලාසි සංග්‍රහය ලැබුණු පසු කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත යොමු කර අනුමැතිය ලබා ගැනීමෙන් අනතුරුව අවශ්‍ය ඉදිරි කටයුතු සිදු කිරීමට නියමිතය.

විගණන හා කළමනාකරණ කමිටු නිර්දේශය

2020 දෙසැම්බර් 31 දිනට ප්‍රථම කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතියට ඉදිරිපත් කළ යුතුය.

(ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය

(i) II වැනි පරිච්ඡේදයේ 13.3 වගන්තිය

නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (විකල්ප අධ්‍යාපන හා ගුරු අධ්‍යාපන) තනතුර සඳහා වැඩ බැලීමට නිලධාරියෙකු පත්කර ඇති අතර, ඊට අතිරේකව ඔහු විසින් අධ්‍යක්ෂ (ගුරු අධ්‍යාපන), අධ්‍යක්ෂ (ආයතනික සංවර්ධන) තනතුරු වල ද වැඩ බලමින් සේවා අවශ්‍යතාවය අනුව රාජකාරී කටයුතු ඉටු කරනු ලබන අතර, එම අතිරේක තනතුරු සඳහා කිසිදු ගෙවීමක් සිදු කරනු නොලැබේ.

අධ්‍යක්ෂ තනතුරු 02 න් එක් තනතුරක් වන අධ්‍යක්ෂ (මුද්‍රණ හා ප්‍රකාශන) තනතුර සඳහා ඩබ්ලිව්.එම්.යූ. විජේසූරිය මහතා වැඩ බැලීමට පත්කර ඇති අතර ඔහු මධ්‍යම කළමනාකරණ ශ්‍රේණියේ (MM 1- 3) වසර 20කට අධික කාලයක් සේවය කර ඇත. ඔහු දැනට සිටින මුද්‍රණාලයේ දැකුමක් නිබෙන ජොෂ්ඨතම නිලධාරියා වන බැවින් අධ්‍යක්ෂ තනතුරෙහි වැඩ බැලීමට පත් කර ඇතත් දැනට ක්‍රියාත්මක බඳවා ගැනීම් පටිපාටිය අනුව ඔහුට ස්ථිරව තනතුර ප්‍රදානය කිරීමට හැකියාවක් නොමැත. දැනට සංශෝධනය වෙමින් පවතින බඳවා ගැනීම් පටිපාටිය අනුව එම තනතුර සඳහා අලුතින් බඳවා ගැනීමට කටයුතු කරනු ලැබේ. එතෙක් සේවා අවශ්‍යතාවය අනුව ඔහුව අදාළ රාජකාරී ඉටු කර ගැනීම සඳහා පත්කර ඇත.

තව ද, අධ්‍යක්ෂ (පුස්තකාල හා කෞතුකාගාර) තනතුර සඳහා ආයතන සභා අනුමැතිය සහිතව මාස 06 ක් සඳහා වැඩ බැලීමට නිලධාරියෙකු පත්කර තිබුණි. ඉන් අනතුරුව 2020.10.14 දින පැවති ආයතන සභාවේ දී ඔහු මේ දක්වා කර ඇති රාජකාරී තනතුරේ ප්‍රගතිය පිළිබඳ වාර්තාවක් ලබා ගෙන සම්මුඛ පරීක්ෂණයක් පවත්වා ඔහු එම තනතුරේ ස්ථිර කිරීමට තීරණය වුව ද, රටේ පැවති කොවිඩ් - 19 ව්‍යසනය නිසා එය ඉටු කර ගැනීමට නොහැකි විය. හැකි ඉක්මනින් මේ පිළිබඳ ඉදිරි කටයුතු සිදු කිරීමට නියමිතය.

මුදල් අයකැමි තනතුර සඳහා අධ්‍යාපන නායකත්ව සංවර්ධන හා කළමනාකරණ පීඨයෙහි කළමනාකරණ සහකාරවරයෙකු පූර්ණකාලීනව සේවයේ යොදවා නොතිබුණි.ඒ අනුව වෙනත් රාජකාරී කටයුතු ඉටු කරනු ලැබූ කළමනාකරණ සහකාරවරියක මුදල් අයකැමි ලෙස සේවයේ යොදවා තිබුණි. ඒ අනුව අතිරේක දීමනාවක් ගෙවා තිබුණි. මෙම කළමනාකරණ සහකාරවරිය පූර්ණකාලීනව මුදල් අයකැමි ලෙස සේවයේ යොදවා අතිරේක දීමනා මුදල් ගෙවීම 2020 දෙසැම්බර් මස සිට අත්හිටුවීමට පියවර ගෙන ඇත.

නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (විකල්ප අධ්‍යාපන හා ගුරු අධ්‍යාපන), අධ්‍යක්ෂ (මුද්‍රණ හා ප්‍රකාශන), අධ්‍යක්ෂ (පුස්තකාල හා කෞතුකාගාර) යන තනතුරු සඳහා ඉතා ඉක්මනින් බඳවා ගැනීම් සිදු කිරීමට කටයුතු කරනු ලැබේ.

විගණන හා කළමනාකරණ කමිටු නිර්දේශය

බඳවා ගැනීම් කටයුතු කඩිනම් කළ යුතුය.

(ii) VIII වැනි පරිච්ඡේදයේ 6.1 වගන්තිය

ජාතික අධ්‍යාපන ආයතනයේ අතිකාල හිමි කාර්ය මණ්ඩලයට කාර්යාල වේලාවෙන් පසුව හා නිවාඩු දිනවල රාජකාරී කිරීම වෙනුවෙන් අතිකාල ගෙවීමේදී ජීවන වියදම් දීමනාව හා අනෙකුත් දීමනා ද ඇතුලත් වන මාසික වැටුප අනුව පැයට පැය $1\ ^1/_2$ ක් වන සේ ගෙවිය යුතු බව 1995.03.22 දිනැති අංක CS/8/1/617/94 දරන සහකාර කම්කරු කොමසාරිස්ගේ ලිපියෙන් ජාතික අධ්‍යාපන ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල් වෙත දැනුම් දී ඇත (ඇමුණුම 02).

එහි ඇති වලංගුතාවය පිළිබඳ ව අධ්‍යක්ෂ ජනරාල් විසින් කම්කරු අමාත්‍යාංශයෙන් විමසීමක් කර ඇති අතර එයට පිළිතුරු වශයෙන් කම්කරු හා වෘත්තීය පුහුණු අමාත්‍යාංශයේ උපදේශක ජී. වීරකෝන් මහතා විසින් 1995.04.21 දිනැති අංක LAB/MIN/AD/95 දරන ලිපිය මගින් ඉහත සහකාර කම්කරු කොමසාරිස්ගේ නිර්වචනය නිවැරදි බව දැනුම් දී ඇත (ඇමුණුම 03).

එවකට සිටි අධ්‍යක්ෂ ජනරාල් විසින් ඉහත තීරණය ද තවදුරටත් සනාථ කර ගැනීම සඳහා අදාළ කරුණු සම්බන්ධයෙන් නීතිපතිගෙන් විමසීම් කර ඇති අතර නීතිපති විසින් උක්ත තීරණය තවදුරටත් සනාථ කරමින් 1995.06.16 දිනැති අංක E/84/95/NIC දරන ලිපිය මගින් උක්ත සහකාර කම්කරු කොමසාරිස්ගේ තීරණය නිවැරදි බව සනාථ කොට ඇත (ඇමුණුම 04).

ඒ අනුව 1996 වර්ෂයේදී පෙර වර්ෂ 06 කට අදාළ ව නොගෙවූ අතිකාල දීමනා ද සමඟ උක්ත සඳහන් සහකාර කම්කරු කොමසාරිස්ගේ ලිපියෙන් අන්තර්ගත වන පරිදි ගෙවීම සිදුකොට ඇත. පසු කාලීන ව ජීවන වියදම් හෝ වෙනත් දීමනා වැටුපට අන්තර්ගතව නොතිබුණු අතර මූලික වැටුප පමණක් වැටුප ලෙස මෙම ආයතනයේ (ව්‍යවස්ථාපිත මණ්ඩල/ ආයතන) සේවකයින්ට ලැබී ඇති බැවින් එම ලද වැටුප පදනම්ව අතිකාල ගෙවා ඇති බව නිරීක්ෂණය වේ. වසර කිහිපයකට පසුව නැවත ජීවන වියදම් දීමනා වැටුප සමඟ ලැබී ඇතත් සිරිත් පරිදි මූලික වැටුප පදනම් කර ගෙනම අතිකාල ගෙවා ඇති බව තවදුරටත් නිරීක්ෂණය කෙරේ.

2016.04.25 දිනැති අංක 02/2016 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛයේ අංක 13.1 , 13.2 මඟින් ඉහත ආකාරයට (දළ වැටුප පදනම් කර ගෙන) අතිකාල දීමනා ගෙවීම අහෝසි කොට ඇත. ඉන් අනතුරුව 2018.04.11 දිනැති අංක DMS/cir/04/2018 දරන කළමනාකරණ සේවා 2/2016 (11) චක්‍රලේඛය මඟින් ඉහත 2016.04.25 දිනැති අංක 02/2016 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛයේ 13.2, 13.3, 13.4 උප වගන්ති සංශෝධනය කොට එම චක්‍රලේඛය බලාත්මක කිරීමට පෙර පැවති ආකාරයට අතිකාල දීමනා ගෙවන ලෙස අවස්ථාව ලබා දී ඇත (ඇමුණුම 05,06).

ඒ අනුව 2016, 2017, 2018 යන වර්ෂවල හිඟ අතිකාල දීමනා ද සමඟ ජීවන වියදම් දීමනාව ද ඇතුලුව ගණනය කරන ලද රේටයන්ට අනුකූලව අතිකාල දීමනා ගෙවන ලෙස ආයතනයේ කම්කරු සංගම් නිරන්තරයෙන් ඉල්ලීම් කරන ලදී. එම ඉල්ලීම් සලකා බලා ඉහත සඳහන් සහකාර කම්කරු කොමසාරිස්ගේ ලිපියේ වර්තමාන වලංගුතාව සම්බන්ධයෙන් විමසීම් කළ අතර ඊට පිළිතුරු වශයෙන් 2018.08.01 දිනැති ලිපියෙන් අංක CS/8/1/617/94 දරන ලිපිය මගින් 1995.03.22 දිනැති සහකාර කම්කරු කොමසාරිස්ගේ ලිපියේ සඳහන් විධිවිධාන දැනටමත් වලංගු බව දන්වා ඇත. (ඇමුණුම 07).

ඉහත දැක්වෙන පරිදි දළ වැටුප පදනම් කරගෙන පැයට පැය 1 $^{1}/_{2}$ ක් වන සේ අතිකාල වැටුප් ගෙවීම සම්බන්ධයෙන් ජාතික අධ්‍යාපන ආයතනයේ 424 වන ආයතන සභා රැස්වීමට උපදෙස් සඳහා ඉදිරිපත් කරන ලද අතර ආයතන සභාව විසින් 2018.04.11 දිනැති අංක DMS/cir/04/2018 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 02/2016 (11) මගින් කළමනාකරණ සේවා 02/2016 හි 13. 3 උප වගන්තිය ඉවත් කිරීම නිසා 2016 සිට හිඟ වැටුප් ද සමඟ දළ වැටුප පදනම් කරගෙන ලැබෙන රේටයන්ට අනුකූලව අතිකාල ගෙවන ලෙස අනුමැතිය ලබා දුන් අතර එය තවදුරටත් කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවට දන්වා සනාථ කර ගන්නා ලෙසට උපදෙස් ලබා දී ඇත. (ඇමුණුම 08).

ඒ අනුව කටයුතු කොට කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවෙන් ද විමසීම් කළ අතර එයට පිළිතුරු ලෙස කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් 2019/08/16 දිනැති අංක DMS/1135/vol/-01 දරන ලිපිය මඟින් සහකාර කම්කරු කොමසාරිස්ගේ ඉහත සඳහන් ලිපියට අනුකූල ව අතිකාල ගෙවීම් සම්බන්ධයෙන් විරුද්ධත්වයක් නොමැති බව දැනුම් දී ඇත. (ඇමුණුම 9).

ඉහත නියමයන්ට අනුකූල වෙමින් අතිකාල ගෙවීම් කරගෙන යන ලෙස අදාළ නිලධාරීන්ට උපදෙස් දී ඇත.

අතිකාල දීමනා ගෙවීමට පදනම් කර ගන්නා වැටුප ආයතනයේ පරිපාලන හා මූල්‍ය රෙගුලාසි සංග්‍රහයට ඇතුළත් කර විධිමත් පරිදි අනුමත කර ගැනීමට කටයුතු කරනු ලැබේ.

විගණන හා කළමනාකරණ කමිටු නිර්දේශය

ඉහත පිළිතුර සමඟ කමිටුව එකඟ වන ලදී.

(ඇ) **භාණ්ඩාගාරයේ කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව මඟින් 2013 වර්ෂයේ දී ආයතනය සඳහා අනුමත කර ඇති අංක 257 දරන චක්‍රලේඛය**

ජාතික අධ්‍යාපන ආයතනයේ අධ්‍යයන කාර්ය මණ්ඩල සති අන්තයේ සහ රජයේ නිවාඩු දිනවල රාජකාරී අවශ්‍යතා මත සේවය කිරීමෙන් උපයන මුදල ඔවුන්ගේ මාසික වැටුපෙන් 50% සීමාවට යටත් නොකරන ලෙස ඔවුන් පහත සඳහන් හේතු මත නිරන්තරයෙන් ඉල්ලීම් කර ඇත.

ආයතනයේ වාර්ෂික සැලසුම් අනුව විවිධ ව්‍යාපෘතිවලට අදාළ ව සැලසුම් කල පරිදි වැඩ කටයුතු ක්‍රියාත්මක කිරීමේදී පාසල් ගුරුවරුන් ද වැඩමුළු සඳහා කැඳවීමට සිදු වන අතර මෙම ගුරුවරුන් අදාළ පාසල්වලින් සතියේ දිනවල නිදහස් නොකරන බැවින් සති අන්ත දිනවල ඔවුන් සහභාගී කර ගැනීමට සිදු වේ.එබැවින් ආයතනයේ අදාළ නිළධාරීන්ට ද සති අන්තයේ දිනවල වැඩමුළු සඳහා පැමිණීමට සිදු වේ.

ගුරු මාර්ගෝපදේශ සැකසීම හා ගුරු පුහුණු වැඩසටහන් නියමිත කාලවකවානුවලදී සකස් කර අවසන් කළ යුතු බැවින් ද ප්‍රමාදයකින් තොරව පාසල් පද්ධතියට ඉගෙනුම් ද්‍රව්‍ය ලබාදිය යුතු බැවින්ද ඉහත කාර්යයන් කඩිනමින් කිරීමට සිදු වන නිසා සති අන්තයේ හා රජයේ නිවාඩු දිනවල ද රාජකාරී කිරීමට සිදු වේ. විගණනා වාර්තාවෙන් පෙන්වා දී ඇති වර්තමානයේ එම නිලධාරීන් විසින් රාජකාරී වේලාවෙන් පසුව සතිය වශයෙන් වැඩ කර උපයාගෙන ඇති කොටසක් බව ඔවුන් දැඩිව කියා සිටී. ඉහත කරුණු සලකා බලා විගණන වාර්තාවෙන් දක්වා පරිදි 50% සීමාව ක්‍රියාත්මක කිරීම මහත් දුෂ්කරතාවයකට පත්ව ඇත. එබැවින් විගණනා හා කළමනාකරණ රැස්වීම්වලදී ද මේ සම්බන්ධයෙන් දිගින් දිගට ම සාකච්ඡා කළ අතර 2020.06.15 දින පැවති රැස්වීමේදී එම සීමාව ඉහළ නංවා ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කළ යුතු බවට තීරණය කර ඇත.

ඉහත කරුණු සැලකිල්ලට ගෙන එම කරුණු කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවට දැනුම් දී චක්‍රලේඛ 257 සංශෝධනය කිරීමට කටයුතු කරන ලෙස විගණන හා කළමනාකරණ කමිටුව උපදෙස් දී ඇති අතර ඊට අනුකූල ව කටයුතු කරමින් පවතී.

මෙම මුදලට අදාලව නිලධාරීන් වෙතින් ඉදිරිපත් වූ ඉල්ලීම් අනුව මේ සඳහා සංශෝධිත අයවීම් ලේඛණයක් පිළියෙල කර ඇත. මේ පිළිබඳව තව දුරටත් පරීක්ෂා කර බැලීමෙන් අනතුරුව තීරණයකට එළඹීමට නියමිතය. විගණන හා කළමනාකරණ කමිටුවේ දී උපදෙස් ලබා දී ඇති පරිදි 257 චක්‍රලේඛයට ඇතුලත් කර ඇති 50% සීමාව කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙතින් ඉහළ නංවා ගැනීමට ද කටයුතු කිරීමට නියමිතය.

විගණන හා කළමනාකරණ කමිටු නිර්දේශය

කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙතින් අනුමැතිය ලබා ගැනීමට අවශ්‍ය කටයුතු කඩිනමින් සිදු කිරීම.

(ඉ) **2010 දෙසැම්බර් 06 දිනැති අංක 19 සහ 2017 මාර්තු 15 දිනැති අංක 33 දරන අතිරේකයන්ගෙන් සංශෝධිත රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 9.3.1 (ආ) වගන්තිය**

ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය අනුව වාහන අලුත්වැඩියා සඳහා ආයතන ප්‍රධානී අනුමැතිය යටතේ රු.200,000/- ක් දක්වා සිදු කල හැකිය. රු. 200,000/- ට වඩා වැඩි වාහන අලුත්වැඩියා සඳහා දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ අනුමැතිය ලබා ගන්නේ නම් ඒ සඳහා රේඛීය අමාත්‍යාංශ ලේකම්වරයාගේ අනුමැතිය ලබා ගත යුතුයි.(3.5 සහ 3.6)

ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 3.1,3.2,3.3,3.5 හා 3.6 යටතේ රු.මි. 100 ක් දක්වා ද 3.4 යටතේ රු.මි.10 දක්වා ද දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුවට අනුමැතිය ලබා දිය හැක. ඒ අනුව වාහන වල අලුත්වැඩියා සිදු කර ඇත්තේ අධිකාරී සීමාවන්ට යටත්ව ප්‍රසම්පාදන කමිටු අනුමැතිය ලබා ගැනීමෙන් පසුව ය. එක් එක් වාහන අලුත්වැඩියාවන් සඳහා ලබා ගන්නා ලද ප්‍රසම්පාදන කමිටු අනුමැතීන් ඇමුණුම 10 මඟින් ඉදිරිපත් කර ඇත.

විගණන හා කළමනාකරණ කමිටු නිර්දේශය

මේ සඳහා මහා භාණ්ඩාගාරයේ රාජ්‍ය මූල්‍ය දෙපාර්තමේන්තුවෙන් පැහැදිලි කිරීමක් ලබා ගත යුතුය. මීළඟ රැස්වීමේ දී ප්‍රගතිය ඉදිරිපත් කල යුතුය.

3. අනෙකුත් විගණන නිරීක්ෂණ

(අ) අදාළ විශ්ව විද්‍යාල හතරෙහි බලධාරීන් සමඟ සාකච්ඡා කොට වහාම මේ පිළිබඳ එකඟතා ගිවිසුම් ඇති කර ගැනීමට කටයුතු කරන ලෙස වැ.ඛ.නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (විකල්ප අධ්‍යාපන හා ගුරු අධ්‍යාපන) වෙත ලිඛිතව උපදෙස් ලබා දෙන ලදී.

විගණන හා කළමනාකරණ කමිටු නිර්දේශය
අධ්‍යාපන අමාත්‍යාංශය හෝ වෙනත් රජයේ ආයතන විසින් ජාතික අධ්‍යාපන ආයතනය වෙත පුහුණුව සඳහා ශිෂ්‍යයින් යොමු කිරීමේ දී අනුගමනය කළ යුතු මාර්ගෝපදේශය සැකසීම.

(ආ) ජාතික අධ්‍යාපන ආයතනය සහ ගුරු සිසුන් අතර ඇප බැඳුම්කරයකට එළඹ නොබිඹම යන තත්ත්වය පිළිබඳ අප ගන්නා ලද පියවර පහත දැක්වේ.
ගුරු සිසුන් ඇප බැඳුම්කරය අත්සන් කළ යුතුව ඇත්තේ අධ්‍යාපන අමාත්‍යාංශය සමඟය. ඊට හේතුව මෙම පාඨමාලාව ක්‍රියාත්මක කිරීම සඳහා අධ්‍යාපන අමාත්‍යාංශය විසින් ප්‍රතිපාදන සපයන බැවිනි. මේ සම්බන්ධව ජාතික අධ්‍යාපන ආයතනය විසින් 2016.01.08 හා 2016.06.28 දිනැති ලිපි මඟින් අධ්‍යාපන අමාත්‍යාංශයට දැනුම් දී ඇත(ඇමුණුම 11).

විගණන හා කළමනාකරණ කමිටු නිර්දේශය
අධ්‍යාපන අමාත්‍යාංශය හෝ වෙනත් රජයේ ආයතන විසින් ජාතික අධ්‍යාපන ආයතනය වෙත පුහුණුව සඳහා ශිෂ්‍යයින් යොමු කිරීමේ දී අනුගමනය කළ යුතු මාර්ගෝපදේශය සැකසීම.

(ඇ) 2009 වර්ෂයේ සිට 2011 වර්ෂය දක්වා නිලධාරීන් 131 දෙනෙකුට නියමිත වැටුපට වඩා වැඩිපුර ගෙවා තිබූ මුදල් අයකර ගැනීමට අදාළ සංශෝධිත නාම ලේඛනය සකස් කර දෙන ලෙස මුදල් දෙපාර්තමේන්තුව වෙත දැනුම් දී තිබූ අතර මුදල් දෙපාර්තමේන්තුව විසින් එය සකස් කර ඇත.
මින් නිලධාරීන් හතර දෙනෙකුගෙන් අයවිය යුතු මුදල් විශ්‍රාම ගැනීමේ දී/ සේවයෙන් ඉවත් වීමේ දී අයකර ගැනීමට කටයුතු කර ඇත. ඒ අනුව ඉතිරි නිලධාරීන් 127 දෙනාගෙන් අදාළ අයකර ගැනීම් සිදු කිරීමට අවශ්‍ය පියවර ගන්නා ලෙස පරිපාලන දෙපාර්තමේන්තුව වෙත උපදෙස් ලබා දී ඇත.

විගණන හා කළමනාකරණ කමිටු නිර්දේශය

අභ්‍යන්තර විගණක විසින් අධ්‍යක්ෂ ජනරාල්ගේ අනුමැතිය මත නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (පාලන මුදල් හා සහාය සේවා) වෙත ඉදිරිපත් කර ඇති අයකර ගත යුතු මුදල දැක්වෙන ලේඛනයේ වෙනස්කම් පවතී නම් මුදල් අංශය හා පරිපාලන අංශය විසින් මසක් තුළ එම වෙනස්කම් හඳුනා ගත යුතුය. ප්‍රගතිය මීළඟ විගණන හා කළමනාකරණ කමිටුව වෙත ඉදිරිපත් කළ යුතුය.

(ඈ) 2020 ගිණුම් වර්ෂයේ දී ජ'නල් සටහන් අංක 21 මඟින් මෙම වටිනාකම ආදායමට ගෙන ඇත (ඇමුණුම 12). අදාළ ශේෂය නිරවුල් කිරීමට කටයුතු කර ඇත.

විගණන හා කළමනාකරණ කමිටු නිර්දේශය

ඉහත පිළිතුර සමඟ කමිටුව එකඟ වන ලදී.

(ඉ) 2006 - 2015 වර්ෂය දක්වා ගෙවිය යුතු අර්ථසාධක අරමුදල හා ඊට අදාළ 50% ක අධිභාරය රු.68,757,865/- ක මුදල 2019.07.11 දිනට පෙර ගෙවිය යුතු බවට කම්කරු කොමසාරිස් විසින් 2019.06.21 දිනැති ලිපිය මඟින් දැනුම් දී ඇති අතර ගෙවීම පැහැර හැරිය හොත් මහේස්ත්‍රාත් අධිකරණයේ නඩු පවරන බවට ද දන්වා ඇත.

එම මුදල ඉතා ඉක්මනින් ගෙවීමේ අදහසින් ජංගම වගකීම් යටතේ ගිණුම් ගත කර ඇත. වාරික වශයෙන් ගෙවීම සඳහා ඉල්ලීමක් කම්කරු කොමසාරිස් වෙතින් ඉල්ලා ඇති අතර මුදල් ප්‍රතිපාදන ජාතික අයවැය

දෙපාර්තමේන්තුව වෙතින් ඉල්ලා ඇත. මේ අනුව 2021 වර්ෂයේ සිට වාරික වශයෙන් ගෙවීමට සැලසුම් කර ඇත.

විගණන හා කළමනාකරණ කමිටු නිර්දේශය
2021 වසරේ ජනවාරි සිට නිරවුල් කිරීමට කටයුතු කළ යුතුය.

(ඊ) අදාළ විස්තර උප ලේඛන අංක 01 මඟින් ඉදිරිපත් කර ඇත.

විගණන හා කළමනාකරණ කමිටු නිර්දේශය

ආයතන සභාව අනුමත කරන අයවැය ලේඛනය අනුව වියදම් දැරීමේ වගකීම මුදල් අංශය වෙත පැවරෙන අතර යම් හෙයකින් ප්‍රමාණාත්මකව සැලකිය යුතු විචලනයක් සිදු වන්නේ නම් ඒ සඳහා අනුමැතිය ලබා ගත යුතු අතර වර්ෂය මැද දී ආයතන සභාවට සංශෝධිත අයවැය අනුමැතියට ඉදිරිපත් කිරීම.

(උ) 2020.03.12 වන විට පොත් 45,556 ක ප්‍රමාණයක් උපලේඛනයට ඇතුලත් කර තිබුණි. 2020.06.15 දින පැවති විගණන හා කළමනාකරණ කමිටුවේ දී විශ්ව විද්‍යාල සිසුන්/ප්‍රායෝගික පුහුණුව ලබන අභ්‍යාසලාභීන් යොදවා මෙම කාර්යය ඉක්මනින්ම අවසන් කළ යුතු බවට නිර්දේශ විය. ඉතිරි පොත් වල සමීක්ෂණ කටයුතු සිදු කර පුස්තකාලයේ පොත් පිළිබඳ නිවැරදි දත්ත ඇතුලත් පොත් වල මිල ගණන් සහිත උපලේඛනයක් සකස් කර මුදල් අංශය වෙත භාර දෙන ලෙස 2020.07.02 දින නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (පාලන මුදල් හා සහාය සේවා) විසින් වැ.බ. අධ්‍යක්ෂ (පුස්තකාල හා කෞතුකාගාර) වෙත උපදෙස් ලබා දී ඇත. මේ වනවිට,

2007.12 31 වන විට පරිග්‍රහණ ලේඛනයට ඇතුලත් වී ඇති පොත් සංඛ්‍යාව	148,544
පරිග්‍රහණ ලේඛනයෙන් තෝරා මිල සඳහන් කල පොත් සංඛ්‍යාව	78,946
තවදුරටත් පරිග්‍රහණ ලේඛනයෙන් තෝරා මිල සඳහන් කළ යුතු පොත් සංඛ්‍යාව	47,702
පරිග්‍රහණ ලේඛණයේ මිල සඳහන් නොවන පොත් ප්‍රමාණය	21,896

පරිග්‍රහණ ලේඛනයෙන් තෝරා මිල සඳහන් කර ඇති පොත් වල වටිනාකම **රු.32,777,031/66** කි.

විගණන හා කළමනාකරණ කමිටු නිර්දේශය

මිල සඳහන් වී නොමැති පොත්වල මිල ගණන් හඳුනා ගන්නා ක්‍රමවේදය පහත කමිටුවෙන් නිශ්චය කිරීම.

ආචාර්ය ඩී. කැප්පෙටිගොඩ මයා (සභාපති)
ටී.මාලනී මිය (සාමාජික)
එස්. වර්ණසිංහ මයා (සාමාජික)

(ඌ) ජාතික අධ්‍යාපන ආයතනයේ අනුමත කාර්ය මණ්ඩලය 652 ක් වන අතර, 2019.12.31 දිනට පුරප්පාඩු 159 ක් වේ. මෙම පුරප්පාඩු 159 න් කථිකාචාර්ය තනතුරු සඳහා බඳවා ගැනීම් සිදු කරනු නොලබන අතර, එය සහකාර කථිකාචාර්ය තනතුරෙහි ශ්‍රේණිගත උසස්වීමක් වේ. තව ද 2017 සහ 2019 වර්ෂවල කථිකාචාර්යවරුන් වශයෙන් සේවය කළ නිලධාරීන් ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය තනතුරට උසස්වීම් ලබා ඇති බැවින් කථිකාචාර්ය තනතුරෙහි පුරප්පාඩු 65 ක් වී ඇත. 2013.03.01 දින සිට ක්‍රියාත්මක බඳවා ගැනීම් පටිපාටිය අනුව අනෙකුත් පුරප්පාඩු තනතුරු සඳහා බඳවා ගැනීමට හැකියාවක් නොමැති වී ඇත්තේ බොහොමයක් තනතුරු සඳහා බඳවා ගැනීම් පටිපාටියේ අවශ්‍ය සුදුසුකම් වැඩිපුර දක්වා ඇති බැවිනි.

විගණන හා කළමනාකරණ කමිටු නිර්දේශය

ඉහත පිළිතුර සමඟ කමිටුව එකඟ වන ලදී.

(එ)

ගිවිසුමට අනුව කොන්ත්‍රාත් කාලය අවසන් වන දිනය	2019.01.03
අධ්‍යාපන අමාත්‍යාංශයේ අධ්‍යක්ෂ (පාසල් ගොඩනැඟිලි) ලබා දුන් කල් දිගුවට අනුව කොන්ත්‍රාත් කාලය අවසන් වන දිනය	2019.12.15

දීර්ඝ කිරීමට හේතු වූ කරුණු පහත දැක්වේ.

- ඉදිකිරීම් ක්ෂේත්‍රයට ඇති වූ ගැටලුකාරී තත්ත්වයන් නිසා අවශ්‍ය අමු ද්‍රව්‍ය (වැලි, පස් ආදිය) වැඩ බිමට සැපයීමට ප්‍රමාද වීම.
- වැසි සහිත කාලගුණික තත්ත්වය (bad weather Condition)
- පාස්කු ඉරිදා ඇති වූ ත්‍රස්ත ප්‍රහාරය නිසා රුපියලට සාපේක්ෂව ඩොලරයේ වටිනාකම ඉහළ යාම.
- බිල්පත් ගෙවීමේ ප්‍රමාදය (භාණ්ඩාගාරයෙන් ප්‍රතිපාදන ලැබීම් ප්‍රමාද වීම).

කොන්ත්‍රාත්කරු ඉදිරිපත් කරන ලද කරුණු සැලකීමට ගෙන සහ මෙම කොන්ත්‍රාත්තුට අවලංගු කර නැවත වෙනත් කොන්ත්‍රාත්කරුවෙකු වෙත පැවරීමෙන් අමතර කාලයක් ගත වන බැවින් ද අඩස් නිම කරන ලද ගොඩනැඟිල්ලක් සඳහා ලංසු කැඳවීමේ දී අමතර පිරිවැයක් වැය වන බැවින් ද කල් දිගුව ලබා දීමට හේතු වී ඇත (ඇමුණුම 13).

මෙම කොන්ත්‍රාත්කරුට ලබා දුන් කල් දිගුව අවසන් වූ පසු (2019.12.15) ලබා දුන් බිල්පත් පරීක්ෂා කිරීමේ දී ප්‍රමාද ගාස්තු ඇතුලත් කර සකස් කරන ලදී. එවිට ගෙවීම් කිරීමට මුදලක් නොවූ බැවින් ප්‍රමාද ගාස්තු අය කිරීමට අවස්ථාවක් නොලැබුණු අතර නැවත 2019.12.15 දින සිට කල් දිගුවක් ලබා දීම නිසා ප්‍රමාද ගාස්තු අය කිරීමකින් තොරව බිල්පත් ගෙවීම් කිරීමට සිදු විය.

විගණන හා කළමනාකරණ කමිටු නිර්දේශය

ඉහත පිළිතුර සමඟ කමිටුව එකඟ වන ලදී.

ආචාර්ය සුනිල් ජයන්ත නවරත්න
අධ්‍යක්ෂ ජනරාල්

සංශෝධිත අයවැයගත වටිනාකම, විගණන විමසුමේ සඳහන් වටිනාකම හා විචලනය පහත පරිදි ය.

විස්තරය	සංශෝධිත අයවැය ගත වටිනාකම රු.	විගණන විමසුමේහි සඳහන් කර ඇති සත්‍ය වටිනාකම රු.	මේ අනුව විචලනය රු.	විචලනයේ ප්‍රතිශතය %
වැටුප් හා වේතන	349,700,000	306,205,629	43,494,371	12
අතිකාල හා නිවාඩු දින	32,630,000	37,226,200	(4,596,200)	(14)
පාරිතෝෂික වියදම්	10,300,000	33,362,685	(23,062,685)	(224)
ගමන් වියදම් (දේශීය)	4,120,000	3,727,030	392,970	10
ගමන් වියදම් (විදේශීය)	3,200,000	2,986,408	213,592	7
ලිපි ද්‍රව්‍ය	55,590,000	52,114,010	3,475,990	6
නඩත්තු වියදම් ගොඩනැගිලි	11,923,000	21,162,868	(9,239,868)	(77)
නඩත්තු වියදම් කාර්යාල උපකරණ	4,400,000	16,033,476	(11,633,476)	(264)
නඩත්තු වියදම් වාහන	6,500,000	5,992,908	507,092	8
නඩත්තු වියදම් යන්ත්‍ර හා ඉලෙක්ට්‍රොනික වියදම්	-	2,726,572	-	0
තැපැල් හා දැන්වීම්	4,553,000	1,890,625	2,662,375	58
ඉන්ධන හා ලිහිසි තෙල්	6,200,000	5,316,130	883,870	14
විදුලිය හා ජල වියදම්	25,797,000	24,277,840	1,519,160	6
සම්පත් දායකයන්ට ගෙවීම්	143,030,000	124,185,960	18,844,040	13
ආරක්ෂක සේවා වියදම්	11,000,000	6,154,270	4,845,730	44
පවිත්‍රතා සේවා වියදම්	25,400,000	20,741,534	4,658,466	18

ඉහත විචලනයන්ට අදාල පැහැදිලි කිරීම් පහතින් දක්වා ඇත.

වැටුප් හා වේතන

විගණන විමසුමේ සත්‍ය වටිනාකම ලෙස දක්වා ඇත්තේ වැටුප් හා වේතන යටතේ ලෙජර් ගිණුම් අංක 103 හා 111 හි එකතුව පමණි. නමුත් මේ යටතට ගිණුම් අංක 113(ETF),112(EPF) සහ 116 (Pension Contribution) යන ගිණුම්වලට අදාල වටිනාකම් ද එකතු විය යුතුය. ඒ අනුව, සත්‍ය වියදම පහත පරිදි වේ.

Account Description	Account No	Rs.
Salaries & wages	103	305,059,667
Salary & wages (Non-executive days' pay)	111	1,145,962
Pension Contribution	116	84,807
ETF	113	8,105,173
EPF	112	32,527,253
Total		346,922,862

ඒ අනුව විචලනය වන්නේ 0.79% ක ඉතා සුළු ප්‍රමාණයකි.

අතිකාල හා නිවාඩු දින

සංශෝධිත අයවැය සකස් කරන අවස්ථාවේ දී අතිකාල හා නිවාඩු දින සඳහා පුරෝකථනය කරන ලද ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවීම සහ ගිණුම්ගත කිරීමේ දී තැන්පත් ගිණුම් යටතේ ගෙවූ අතිකාල හා නිවාඩු දින ගෙවීම් ද ඇතුළත් කිරීම නිසා මෙම විචලනය සිදු වී ඇත. ඒ අනුව මෙම 14% විචලනය සිදු වූ බව පැහැදිලි වේ.

පාරිතෝෂික වියදම්

අවසන් ගිණුම්වල පාරිතෝෂික වියදම් ලෙස පෙන්වා ඇත්තේ 2019 වසරට සියලුම සේවකයන් සඳහා පාරිතෝෂික ගෙවීම් වෙනුවෙන් වෙන් කරන ලද මුදලයි.

එහෙත් අයවැය ලේඛනය සකස් කරන අවස්ථාවේ දී ඇස්තමේන්තු කරනු ලබන්නේ අදාළ වසරේ විශ්‍රාම යාමට අපේක්ෂිත නිලධාරීන්ට ගෙවීමට නියමිත පාරිතෝෂික මුදල් ප්‍රමාණයයි. ඒ අනුව 2019 වසරේ දී පාරිතෝෂික දීමනා ලෙස ගෙවා ඇත්තේ රු. 10,325,071/29 කි. ඒ අනුව, විචලනය 0.24% කි.

ගමන් වියදම් (දේශීය,විදේශීය),ලිපි ද්‍රව්‍ය, නඩත්තු වියදම් වාහන, ඉන්ධන හා ලිහිසි තෙල්, විදුලිය හා ජල වියදම්, සම්පත් දායකයන්ට ගෙවීම්

සංශෝධිත අයවැය අගයන් සමඟ සසඳා බැලීමේ දී පහත දක්වා ඇති අයිතම 07හි ම විචලනය 15% අඩු අගයන් ගනී. අයවැය සකස් කරන්නේ ඇස්තමේන්තුගත වියදම් පදනම් කරගෙන බැවින් මෙවැනි සුළු විචලනයන් ඇති වීම සාමාන්‍ය තත්ත්වයකි.

ගමන් වියදම් (දේශීය)	10%
ගමන් වියදම් (විදේශීය)	7%
ලිපි ද්‍රව්‍යය	6%
නඩත්තු වියදම් වාහන	8%
ඉන්ධන හා ලිහිසිතෙල්	14%

විදුලිය හා ජලය වියදම්	6%
සම්පත් දායකයන්ට ගෙවීම්	13%

නඩත්තු වියදම් යන්ත්‍ර හා ඉලෙක්ට්‍රොනික වියදම්

මෙම වියදම් අයිතමයෙහි අයවැයගත වටිනාකම සහ සත්‍ය වටිනාකම ලබා ගෙන ඇති ආකාරය පැහැදිලි නැත.

තැපැල් හා දැන්වීම්

මෙම වියදම් අයිතමය යටතේ තැපැල් ගාස්තු සඳහා පමණක් වියදම් කල ප්‍රමාණය (රු.1,890,625/) විමසුමෙහි දක්වා තිබුනා ද මූල්‍ය ප්‍රකාශනා තුළ දැන්වීම ගාස්තු වෙනම දක්වා ඇත. එම දෙකෙහි එකතුව තැපැල් හා දැන්වීම් යටතේ අයවැයගත වටිනාකම සමඟ සැසඳීම් කළ යුතුය.

මූල්‍ය ප්‍රකාශනයේ දැන්වීම් ගාස්තු යටතේ රු.4,267,242/60 ක වියදමක් දක්වා තිබුණ ද ඉන් රු. 2,068,139/-ක් තැන්පතු ගිණුමක් යටතේ අධ්‍යාපන අමාත්‍යාංශය විසින් දරන ලද වියදමක් වන අතර එය අත්වැරදීමකින් මෙම දැන්වීම් ගාස්තු සමඟ එකතු කර තිබේ. එම ප්‍රමාණය දැන්වීම් ගාස්තු වලින් ඉවත් කල විට නිවැරදි දැන්වීම් ගාස්තු වියදම විය යුත්තේ 2,199,103.60 කි. ඒ අනුව තැපැල් හා දැන්වීම් යටතේ මුලු වියදම රු. 4,089,728.60 ක් වන අතර විචලනය 10.2% කි. මෙවැනි අඩුපාඩු ඉදිරියේ දී සිදුනොකිරීමට අදාළ නිලධාරීන්ට උපදෙස් ලබා දී ඇත.

පවිත්‍රතා සේවා වියදම්

පවිත්‍රතා සේවා වියදම් යටතේ මූල්‍ය ප්‍රකාශන වල සඳහන් කර ඇත්තේ 2019 වසරේ පවිත්‍රතා සේවා සඳහා දරන ලද මුළු වියදමයි. නමුත් 2018 වසරේ නොවැම්බර්, දෙසැම්බර් මාස දෙක සඳහා ගෙවිය යුතුව තිබූ බිල්පත් දෙකෙහි අගය වූ රු. 4,379,660/74 ක ප්‍රමාණය ගෙවා ඇත්තේ 2019 වර්ෂයේ ආරම්භයේ දී 2019 වසරේ ප්‍රතිපාදන ප්‍රමාණය තුලිනි. ඒ සඳහා අමතර රු. මිලි 3.4 ක් ප්‍රමාණයක් ඉංජිනේරු සේවා දෙපාර්තමේන්තුව විසින් සැලසුම් දෙපාර්තමේන්තුව වෙතින් ඉල්ලුම් කරන ලද අතර එයට අදාලව සංශෝධිත අයවැය රු. මිලියන 25.4 ක් දක්වා වැඩි කරන ලදී. ඒ අනුව මුළු වියදම රු. 25,121,194/74 ක් වන අතර විචලනය 1.09% කි.

<u>නඩත්තු වියදම් ගොඩනැගිලි හා කාර්යාල උපකරණ</u>

